**මාසික මහ සභා රැස්වීම් වාර්තාව**

ස්ථානය :- රඹුක්කන ප්‍රාදේශීය සභාව
දිනය :- 2025.12.02
වේලාව :- පෙ.ව. 10.00

**සහභාගිත්වය**

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ර්.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
14. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
15. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
16. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
17. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
18. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
19. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
20. වී.ආර්.ර්.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
21. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
22. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
23. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
24. පී.ජී.මල්ලිකා මැතිතුමිය
25. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
26. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
27. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
28. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
29. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
30. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
31. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
32. එච්.ආර්.ප්‍රදිපා රංජනී මැතිතුමිය
33. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
34. එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
35. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
36. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
37. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

**නිලධාරී සහභාගිත්වය**

❖ ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) 2025.11.11 දින පැවති මාසික මහා සභා වාර්තාව සම්මත කිරීම.**

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.11.11 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද එසේ නොමැති නම් 2025.11.11 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

රටේ පවතින ව්‍යසනකාරී අයහපත් කාලගුණය නිසා ඒ සම්බන්ධව කාලය හා ශ්‍රමය කැපකිරීමට ඇති බැවින් මෙම සභා වාරය අනවශ්‍ය ලෙස කාලය අපතේ නොයවා හැකි ඉක්මනින් අවශ්‍ය කටයුතු සාකච්ඡා කොට සභා කටයුතු කරගෙන යාමට ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කරන බව ප්‍රකාශ කරන ලදී.

සංශෝධන

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පසුගිය සභා වාරයට අදාළ වාර්තාවේ නිවැරදි කිරීම් කිහිපයක් පවතින බව ප්‍රකාශ කර අතර ඒ අනුව,
පිටු අංක 07 හි විපක්ෂ මන්ත්‍රීවරුන් සභා ගර්භයෙන් පෙරවරු 10.45 ඉවත්ව ගියා ලෙස සටහන්ව ඇත.
නමුත් එය,

1. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
2. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
3. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
4. පී.ජී.මල්ලිකා මැතිතුමිය
5. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
6. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
7. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
8. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
9. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
10. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
11. එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
12. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
13. එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
14. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
15. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
16. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

යන සභිකයින් 16 දෙනෙකු පෙරවරු 10.45ට සභාගර්භයෙන් ඉවත්ව ගිය අතර ස්වාධීන මන්ත්‍රීවරයකු වන වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා සහ සභිකයින් 18 දෙනෙකු සභාගර්භයේ රැඳී සිටි අතර සනපූර්ණය පැවති බැවින් සභා කටයුතු ඉදිරියට කරගෙන යාමට සභාපතිතුමා තීරණය කළ බවත්,

පිටු අංක 11 හි, ඒ අනුව විපක්ෂයේ එක් ස්වාධීන මන්ත්‍රීවරයෙක් හැර විපක්ෂයේ අනෙකුත් සියලුම මන්ත්‍රීවරුන් සභාගර්භයෙන් ඉවත් වූ අතර ඒ ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් 2026 වර්ෂයේ අයවැය කෙටුම්පත සභා සම්මත විය ලෙස සටහන් ඇත.
නමුත් එය,
2026 වර්ෂයේ අයවැය කෙටුම්පත සභා සම්මත කිරීම සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න සභාපතිතුමා විසින් විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**
ස්වාධීන මන්ත්‍රීවරයකු ලෙස තමා සභාව නියෝජනය කරන බවත් 2026 අයවැයට පක්ෂව හෝ විපක්ෂව කටයුතු නොකරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
එසේ නම් ඡන්දයකට යා යුතු බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකි සිටි අතර වැඩි ඡන්දයෙන් 2026 අයවැය කෙටුම්පත සභා සම්මත විය.
ලෙසත් සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

පිටු අංක 18 හි, වෛද්‍යාධාර සඳහා මුදල් දීමට අනුමැතිය ලබා ගැනිමේ යෝජනාවෙහි බී.ප්‍රේමාවති, වලිකොටුවවත්ත ලෙස සටහන් වී ඇත. එය බී.සෝමාවති, වල්කොටුවවත්ත ලෙස නිවැරදි විය යුතු බවට සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**
මෙම සභා වාර්තාව සම්මත කිරීම බොහෝ අඩුපාඩු පවතින බැවින් අපහසු බවත්, ඔහු විසින් ඉදිරිපත් කරන ලද කිසිදු සංශෝධනයන් හා අදහස් ප්‍රකාශ කිරීම් කීපයක්ද නොමැති බවත්, මෙය කුමන්ත්‍රණකාරි තත්වයක්ද යන්නත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
කිසිදු කුමන්ත්‍රණකාරී තත්ත්වයක් නොමැති බවත්, ඔබතුමන් ඒ සම්බන්ධව ඉදිරිපත් කිරීමට ඇති සංශෝධන මේ අවස්ථාවේ ප්‍රකාශ කරන ලෙසත් දන්වා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**
ඔක්තෝම්බර් මාසයේ (2025.10.08) වාර්තාවේ සංශෝධන නොවැම්බර් මාසයේ (2025.11.11) වාර්තාවේ ඇතුළත් වී නොමැති බවත්, එම සංශෝධන දෙසැම්බර් මාසයේ (2025.12.02 දින) වාර්තාවට ඇතුළත් කිරීම නිෂ්ඵල බවත්, ඊට හේතුව ලෙස එම වාර්තාව දෝෂ සහිතව සභා සම්මත වන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
පසුගිය සභා වාර්තාවක ඇතුළත් විය යුතු දෙයක් ඉදිරි සභා වාරයකදී සංශෝධනය යටතේ ඉදිරිපත් කිරීමට නීතිමය බාධාවක් නොමැති බවත්, මෙම අවස්ථාව යොදාගෙන ඇත්තේ එවැනි සංශෝධනය ඉදිරිපත් කිරීමට බැවින් ඔබතුමාගේ එම සංශෝධනය ඉදිරිපත් කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා මෙන් ඉල්ලා සිටින ලදී. මෙසේ වාර්තාවේ ප්‍රකාශ කළ අදහස් ඇතුළත් නොවීමට ප්‍රධානතම හේතුව වන්නේ සන්නිවේදන දෝෂ බවත්, සෑම අදහස් ප්‍රකාශ කිරීමකදීම මයික් එක ක්‍රියාත්මක කර අදාළ ප්‍රකාශය සිදු කිරීමට කාරුණික වන ලෙස දන්වා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**
ඔහු විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන කිසිවක් මෙම වාර්තාවේ ඇතුළත් වී නොමැති බැවින් ඊට විරෝධතාවයක් ලෙස සංශෝධනය කිසිවක් ඉදිරිපත් නොකර සිටින බවත්, මෙම වාර්තාව අසත්‍ය වාර්තාවක් බවත් ප්‍රකාශ කරන ලදී.
තවද සංදේශ,පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම් යටතේ පිටු අංක 03 හි ඔහු විසින් ඉදිරිපත් කරන ලද එස්.ගයාන් මහතාගේ බිරිඳ අසනීප තත්ත්වයෙන් පසුවන නිසා වෛද්‍යාධාර ලබා ගැනීමට ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.ලෙස සටහන් වුවත් එය වෛද්‍යාධාර නොව නිවාස ආධාර ලෙස නිවැරදිය යුතු බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි පී.ජී.මල්ලිකා මැතිතුමිය**

පිටු අංක 37 හි සපු කන්ද මාර්ගය නොව කපු කන්ද මාර්ගය ලෙස නිවැරදි විය යුතු බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 37 හි පාර්ශවිකයකු ලෙස සටහන්ව ඇත. තමා එසේ නොපැවසූ බවත්, එය ඥාතියකු ලෙස සටහන් විය යුතු බවත්, සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

පිටු අංක 03 හි සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදන යටතේ රඹුක්කන අශෝක ක්‍රීඩාංගනය පින්තාරු කිරීම සම්බන්ධ යෝජනාව සම්බන්ධව සභාපතුමාගේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටි අතර එය සභා දේපලක් බැවින් ප්‍රචාරක දැන්වීම් සවිකිරීම සම්බන්ධව විපක්ෂ මන්ත්‍රීන් විරුද්ධත්වය ප්‍රකාශ කළ නමුත් වාර්තාවේ එය සටහන් වී නොමැති බව ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 06 හි අයවැය ඉදිරිපත් කිරීමට විරෝධතාවය අතරතුර ඔහු විසින් ප්‍රකාශ කරන ලද අදහස වන වෙනත් වසර වලදී අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීමට විශේෂ මහ සභාවක් කැඳවූ බවත්, මෙවර අයවැය කෙටුම්පත විවාදයට ගැනීමට වෙනත් දිනයක් අවශ්‍ය බව විපක්ෂයේ මතය වූ බවත්, එම නිසා ඡන්දයකට යෑම සුදුසු බවත් පැවසූ අතර එය සිදු නොවූ බවත්, ඔහුගේ ප්‍රකාශය වාර්තාවේ ඇතුළත් කර නොමැති බවත් ඡන්දයකට නොයන බැවින් විපක්ෂ මන්ත්‍රීවරුන් සභා ගර්භයෙන් ඉවත්ව යන බව ප්‍රකාශ කරන ලද බව දන්වා සිටින ලදී.

පිටු අංක 07 හි දසනායක මන්ත්‍රීතුමා විසින් කරන ලද ප්‍රකාශය සභාපතිතුමා විසින් සිදු කළ යුත්තක් බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සභා ගර්භයෙන් ඉවත්ව යාමට පෙර බොහොම යටහත් පහත්ව ගෞරවයෙන් ඉල්ලා සිටියා අයවැය කෙටුම්පත විවාදයට ගැනීමට වෙනත් විශේෂ දිනයක් අවශ්‍ය බවත් සභාගර්භයෙන් පිටත්ව යන්නේ අයවැය විවාදය වන මොහොත දක්වා පමණක් බවත්, මහ සභාවට නැවත පැමිණෙන බවත් ප්‍රකාශ කළ අතර මහ සභා වාර්තාව දින හතරකට පෙර ලැබී ඇති බව සත්‍ය නමුත් අයවැය කෙටුම්පත යනු වර්ෂයකට අදාලව සකස් කරන ලද වාර්තාවක් බැවින් එය අධ්‍යයනය කිරීමට කාලය අවශ්‍යය බැවින් විශේෂ දිනයක් ඉල්ලූ බවත්ය. නමුත් වාර්තාවේ සටහනව ඇත්තේ සභාගර්භයේ ඝෝෂාකාරී බව යන්න සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 08 හි සභාපතිතුමාගේ ප්‍රකාශයෙහි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ විරෝධය මැද මම තීන්දුවක් ගත්තා වෙනත් දිනයක් ලබා දීමටත්, එහෙත් එය නොසලකා විපක්ෂයේ මන්ත්‍රීවරුන් සභාගර්භයෙන් පිටතට ගිය බවත්, සටහන්ව ඇති නමුත් විපක්ෂ මන්ත්‍රීන් සභාගර්භයේ සිටින විට එවැන්නක් ප්‍රකාශ නොකළ බවත් සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අනවශ්‍ය ප්‍රශ්න තර්ක ඉදිරිපත් කිරීමෙන් වළකින ලෙසත්, එවිට වාර්තාව සකසන නිලධාරීන් අපහසුතාවයට පත්වන බවත්, සංශෝධන සඳහා අවස්ථාවක් ලබා දෙන්නේ මුද්‍රණ දෝෂ හා තමන් විසින් ඉදිරිපත් කළ අදහසක් නොමැති නම් එය ඉදිරිපත් කිරීමත්, වැරදි නිවැරදි කර ගැනීම සඳහා පමණක් බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පිටු අංක 13 හි සඳහන් රු10,000.00 කලින් ගෙනා යෝජනාවක් නැවත ඉදිරිපත් කර ඇති බවත්, මීට පෙර ඉදිරිපත් කළ යෝජනාවක සංශෝධනයක් මාස හයක් යාමට පෙර නැවත සභාවට ඉදිරිපත් කිරීමේ හැකියාවක් පවතීද යන්න පිළිබඳව ප්‍රශ්න කරන ලදී.

සභා ගර්භයේ සෝෂා

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ හදිසි ආපදා තත්ත්වය හමුවේ අනවශ්‍ය ලෙස විවාද වලට නොයන ලෙස කාරුණිකව ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී. තවද පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් එකට එක්ව සභා කටයුතු ඉදිරියට කරගෙන යාමට තෙන්නකෝන් මන්ත්‍රීතුමාගේ සහාය ලබා දෙන ලෙසත්, ගියවර විපක්ෂ තරුණ මන්ත්‍රීවරුන් සභාගර්භයෙන් පිටතට රැගෙන ගොස් සභාව කඩාකප්පල් කිරීමට උත්සාහ දැරීම සම්බන්ධව පක්ෂ මන්ත්‍රීන්ගේ පිළිකුල, කණගාටුව ප්‍රකාශ කරන බවත්, මෙම වාර්තාවේ වෙනත් සංශෝධන නොමැති නම් සභා සම්මත කරන ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

රු 12,500.00 ට විරුද්ධත්වයක් නොමැති බවත්,මෙසේ යෝජනා සංශෝධනයක් නැවත මාස හයක් යන තෙක් සභාවට ඉදිරිපත් කළ නොහැකි බවත්, එය වාර්තාවේ සටහන් වී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

(ඊ) 07 යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබුණත් අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී සභාගර්භයේ නොසිටි බැවින් එම යෝජනාව ප්‍රතික්ෂේප කර ඇති බවත්, එසේ කිරීමට සභාපතිතුමාට නිෂේධන බලයක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

සභාපතිතුමනි,මෙම අවස්ථාව පවතින්නේ සංශෝධන ඉදිරිපත් කිරීමට බැවින් අනවශ්‍ය ප්‍රශ්න මතු කරන බැවින් තෙන්නකෝන් මන්ත්‍රීතුමාට ආවවාද කරන ලෙස හෝ සභාගර්භයෙන් ඉවත් කිරීමට හෝ කටයුතු සිදු කරන ලෙස දන්වා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

තෙන්නකෝන් මන්ත්‍රීතුමාගේ යෝජනාව සභාවට ඉදිරිපත් කළ බවත්, එය වාර්තාවේ ඇතුළත් බවත්, එම යෝජනාව ප්‍රතික්ෂේප වීමට හේතුවත් වාර්තාවේ පැහැදිලිව ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වෙනත් සංශෝධන නොමැති බැවින් 2025.11.11 දින වාර්තාව සභා සම්මත කරන ලෙසට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

2025.11.11 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරිමට ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.11.11 දිනැති මහ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශයට පත් කරන ලදි.

(ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදන.

01. පසුගිය සතිය තුළ අප සැවොම අයහපත් කාලගුණයත් සමඟ රටම විශාල ඛේදවාචකයකට මුහුණ දීමට සිදුවූ බවත්, පළමුව සුළු සුළු ආපදා පැමිණියත් කඩුගන්නාව නාය යාමත් සමඟ බොහෝ ආපදාවන් පටන් ගත් බවත්, පසුගිය ඉරිදා දින තලගොල්ල ආසනයේ විශාල මාර ගසක් ඉදිරි වැටුණ අතර පද්මසිරි මන්ත්‍රීතුමා රාත්‍රී 9.00 පමණ සභාවේ බැකෝ යන්ත්‍රය ගැනීමට අවශ්‍ය බව දන්වා සිටි අතර රියදුරු මහතා නිවසෙහි සිටි මොහොතක ධාරානිපාත වර්ෂාව නොතකා රියදුරු සේනානායක මහතාගේ උත්සාහය නිසා පාන්දර 3.00 පමණ වන විට එම මෙහෙයුම අවසන් කර කාන්තාවකගේ ජීවිතයක් බේරා ගැනීමට හැකියාව

ලැබුණා. රියදුරු සේනානායක මහතාට ඔහුගේ සහයෝගය ලබාදීම සම්බන්ධව විශේෂ ස්තූතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව ප්‍රකාශ කරන ලදී.

විශේෂයෙන්ම බදාද දින රාත්‍රී 10.30 පමණ වෙනකම් පින්නවල සත්ව උද්‍යානය අසල ගසක් කපා ඉවත් කිරීම සඳහා අපගේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන්, සෞඛ්‍ය කම්කරුවන් භේදයකින් තොරව ධාරාණිපාත වර්ෂාව නොතකා සහයෝගය දැක්වූ බවත් ප්‍රකාශ කරන ලදී.

02. වල්ආර ඔය ජල පහරට සභාපතිතුමාගේ වාහනය හසු වූ බවත් එහිදී තමාත්, එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා සහ රියදුරු මහතාත් මහත් පරිශ්‍රමයක් දරා ජීවිතය බේරාගත් බවත්, පසුදා අපේ සභාවේ සේවකයින් ආපදා කණ්ඩායමක් විදිහට කැඳවා දවස් දෙකක් පුරාවට රඹුක්කන ආසනයේ සියලුම අපදාවට ලක් වූ ප්‍රදේශ වලට ගොස් සහන සේවා කටයුතු ආරම්භ කළ බවත්, ඒ සඳහා උදව් උපකාර කළ මන්ත්‍රීතුමන්ලාට/තුමියන්ලාට හා රාජ්‍ය ආයතනවල සියලුම නිලධාරීන්ට ස්තූතිය පුදකරන බව ප්‍රකාශ කරන ලදී. නන්දික බණ්ඩාර මැතිතුමා අපගේ රෝහලේ අනතුරුදායක ගසක් ඔහුගේ පුද්ගලික වියදමින් ඉවත් කිරීමට වෙහෙසුණු බවත්, එතුමා සැබෑ මහජන නියෝජිතයෙක් බවත්, එතුමාට ස්තූතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

රඹුක්කන දිසා රෝහල පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට අවශ්‍ය බවත්,ඒ අනුව එහි සිටි වෛද්‍යවරයා හැසිරුණු ආකාරය ඉතා අශෝබන බවත්, නිදහස් අධ්‍යාපනය භුක්ති විඳ වෛද්‍යවරයෙකු වූ එතුමා මෙවැනි ව්‍යසනකාරී අවස්ථාවක හැසිරුණු ආකාරය සුදුසු නැති බවත්, මෘතදේහයන් ගෙනවිත් භාර දුන් පසු භාර ගැනීමට නොහැකි බව පවසා මා හා ගැටුමකට ආ බවත්, මාගේ තර්ක හමුවේ එය භාර ගැනීමට සිදු වූ බවත් ප්‍රකාශ කරන ලදී. කඳවුරු වල සිටින මහජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය සොයා බැලීම සඳහා සභාව මැදිහත් වී වාහනයක් සොයා දුන් බවත්, ඔහුගේ නිල රථය නොමැති අවස්ථාවේ මිතුරෙකු විසින් වාහනයක් ලබා දුන් බවත්, එම වාහනයේ නිල ප්‍රකාශයක් නොමැති බැවින් කඳවුරු කරා යාමට DMO මහතාට නොහැකි බව ප්‍රකාශ කරන ලදී. ඒ සම්බන්ධව මන්ත්‍රී මණ්ඩලය දැනුවත් විය යුතු බවත්, එම වෛද්‍යවරයා(DMO) සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට පැමිණිලි කර ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව ද ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන් ශ්‍රී ලංකා පොලිසියට, විදුලිබල මණ්ඩලයට මහවැසි නොතකා විදුලි බිඳවැටීම් නිරාකරණය කරමින් දැක්වූ සහයෝගයට කෘතඥතාවය ප්‍රකාශ කරන අතර සමහරු සමාජ මාධ්‍ය ඔස්සේ වීරයන් වීමට කටයුතු කරන අවස්ථාවල ඒ පිළිබඳව අප කණගාටුව ප්‍රකාශ කරන බවත් ප්‍රකාශ කරන ලදී.

රඹුක්කන ආසනය අනතුරු අතින් අවම තත්ත්වයක පැවතියත් ජීවිත අනතුරු හතක් දැනට වාර්තා වී ඇති බවත්, දේපල හානි වීම් බොහෝමයක් පවතී. අවතැන්වීම් බොහෝමයක් පවතින බවත්, සභා කාර්යාලයේ නිලධාරි මහත්ම මහත්මීන් කිහිපදෙනෙකුටද මෙම ඛේදවාචකය බලපා තිබෙන බවත්, ඔවුන් පිළිබඳ අපගේ අවධානය යොමු කළයුතු බවත්, නන්දික මන්ත්‍රීතුමා වගේ සැවොම එක්ක මෙම ව්‍යසනකාරී තත්ත්වයෙන් ගොඩ ඒමට කටයුතු කරමුයි ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවතී ජල බහුසරය සභාවට ලබාගත් බවත්, අද දින ගොස් ට්‍රැක්ටරය ද ලබාගත් අතර ඉදිරියේදී එය සභා සන්තකයට ලබා ගැනීමට අදහස් කරන බවත්, චක්‍රලේඛන අණ පනත් පැවතිය ද මහජනයාගේ සුබ සිද්ධිය උදෙසා ඒවා පසෙකලා කටයුතු කිරීමට ජනාධිපතිවරයා විසින් බලය ලබා දුන් බවත්, එය අනිසි ලෙස ප්‍රයෝජනයට නොගෙන මෙම ව්‍යසනකාරී තත්වයට මුහුණ දීමට පමණක් යොදා ගැනිම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**(ඈ). සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

01. අසනිප බැවින් 2025.12.02 දින පැවැත්වෙන මහ සභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2025.12.02 දින පැවැත්වෙන මහ සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමාට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබාදීම ගරු මහ සභාව විසින් අනුමත කරන ලදි.

02. අසනිප බැවින් 2025.12.02 දින පැවැත්වෙන මහ සභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2025.12.02 දින පැවැත්වෙන මහ සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමියට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබාදීම ගරු මහ සභාව විසින් අනුමත කරන ලදි.

03. අසනිප බැවින් 2025.12.02 දින පැවැත්වෙන මහ සභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් දුරකථනයෙන් දැනුම් දීමක් සිදු කළ ඇති බැවින් ගරු සභාපතිතුමන් විසින් ගරු මහ සභාවට එය ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2025.12.02 දින පැවැත්වෙන මහ සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමාට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබාදීම ගරු මහ සභාව විසින් අනුමත කරන ලදි.

**(ඇ). සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරිම.**

සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් වී නොමැති බවට ගරු සභාපතිතුමන් විසින් මහ සභාවට දැනුම් දෙන ලදි.

**(ඉ). යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න**

යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න නොමැති බවට ගරු සභාපතිතුමන් විසින් මහ සභාවට දැනුම් දෙන ලදි.

**(ඊ). යථාපරිදි කල්දී ඇති යෝජනා**

**(ඊ).01.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

i. 2026 වර්ෂය සඳහා මහ සභාව පැවැත්වීමට පහත සඳහන් දිනයන් තීරණය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

| | |
|---|---|
| ජනවාරි | - 06 - අඟහරුවාදා |
| පෙබරවාරි | - 03 - අඟහරුවාදා |
| මාර්තු | - 04 - බදාදා |
| අප්‍රේල් | - 07 - අඟහරුවාදා |
| මැයි | - 05 - අඟහරුවාදා |
| ජූනි | - 09 - අඟහරුවාදා |
| ජූලි | - 07 - අඟහරුවාදා |
| අගෝස්තු | - 04 - අඟහරුවාදා |

| | |
|---|---|
| සැප්තැම්බර් | - 08 - අඟහරුවාදා |
| ඔක්තෝම්බර් | - 06 - අඟහරුවාදා |
| නොවැම්බර් | - 03 - අඟහරුවාදා |
| දෙසැම්බර් | - 08 - අඟහරුවාදා |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඊළඟ වර්ෂයේ සභාව පැවතිය යුතු දිනයන් දෙසැම්බර් මස දී යෝජනා කර සම්මත කරගත යුතු බව ප්‍රකාශ කරන ලදි.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
ඉහත දිනයන් හිදී මහ සභාව පැවැත් වීම අනුමත කිරිම තීරණය විය.

ii. සභා අරමුදල් 2024 යටතේ ප්‍රාදේශීය සභා සංකීර්ණයේ වම් පස ගොඩනැගිල්ල ඇතුළත තීන්ත ආලේප කිරීම සඳහා වන ව්‍යාපෘතියේ රැඳවුම් මුදල වන රු.25,952.22 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු.25,952.22 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

iii. සභා අරමුදල් 2024 යටතේ රක්තහේන පන්සල මාර්ගයේ පිරිවෙන කොටස සංවර්ධනය කිරීම කර්මාන්තයට අදාළ රැඳවුම් මුදල් වන රු.7,756.33 ක මුදල නවෝදා ග්‍රාම සංවර්ධන සමිතියට ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු.7,756.33 ක මුදල නවෝදා ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

iv. රඹුක්කන නගර නිවාස ඉඩමෙහි (ජාකොබ් වත්ත) ඇති ගොඩනැගිල්ල බිම්සවිය ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපනය කිරීම සඳහා වර්ග අඩි 1000 -1200 පමණ වපසරියක් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා ඇත.මේ සඳහා තක්සේරුවට යටත් සාධාරණ මාසික කුලී මුදලක් ගෙවීමට හැකියාවක් පවතින බවද, විදුලි, ජලය, දුරකථන ගාස්තුවද ගෙවන බවද දන්වා ඇත. මේ සම්බන්ධ තීරණයක් ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රඹුක්කන නගර නිවාස ඉඩමෙහි සභාව සතු කාර්යාලයක් සකස් කර තිබෙන අතර එය රථවාහන අංගනයක් ලෙස සකස් කර ඇති බවත්, මුරකරුට සිටීමට නිවස ඉදිකර ඇති බවත්, අක්‍රමිකතා සිදු වී ඇති බවත්, එම නිසා එය ලබාදීමට අකමැත්තක් පවතී ද යන්න අසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

ජල, විදුලිය එම නිවසට ලබාගෙන තිබේද යන්න ප්‍රශ්න කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ලබාගෙන නොමැති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

සභා දේපලක් බැවින් ජල, විදුලිය, දුරකථන සැපයුම සභාව නමින් ලබාගත යුතු බවත්, ජල, විදුලිය, දුරකථන බිල්වල වටිනාකම තක්සේරු වටිනාකමට වඩා වැඩි වුවහොත් සභාවට පාඩුවක් සිදුවන බැවින් එම දෙපාර්තමේන්තුව සමග ගිවිසුමකට යායුතු බවත්, මාසික කුලියට අමතරව මාසික ජල, විදුලිය, දුරකථන බිල්ද ඔවුන් විසින් ගෙවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එම ස්ථානයට ජල, විදුලිය, දුරකථන සැපයුම ලබාදී නොමැති බවත්, එය සභාව විසින් සිදු කර දිය යුතු බවත්, ඔවුන් ජල, විදුලිය, දුරකථන බිල් මාසිකව ගෙවීමට එකඟ බවත්, එම පරිශ්‍රයට ඇතුලු වීමට නොහැකි නීතිමය බාධාවක් පැවැති බවත්, එය දැන් ඉවත්ව ඇති බවත්, සති දෙකකට විතර ඉහතදී එම ස්ථානයට ගොස් එළිපෙහෙළි කළ බවත් ප්‍රකාශ කරන ලදී.

- **අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.**

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ දේපල බදු දීම සම්බන්ධව ගිවිසුමක් සකස් කර එය මහ සභාවට ඉදිරිපත් කර අනුමත කර ගැනීම සුදුසු බවට තීරණය විය.

v. විවිධ ණය හිමි ගිණුම නමින් මූල්‍ය ප්‍රකාශනවල පවතින ලෙජර් ගිණුමෙහි 2024.12.31 දිනට 2,433,915.00 ක උපලේඛන නොමැති ශේෂයන් පවතී. මෙම ශේෂය සොයා ගැනීම සඳහා 2024 වර්ෂයේ සිට 2007 වර්ෂය සඳහා අවසාන ගිණුම් ගොනු ණයහිමි උපලේඛන,

ප්‍රධාන ලෙජර්වල ඇති ගිණුම් පරීක්ෂා කිරීම් සිදු කළ ද එම ශේෂය සඳහා ගැලපෙන ණය හිමියන් තිබේද යන්න සොයා ගැනීමට නොහැකි විය. ණයහිමියන් සඳහා ණයහිමි උපලේඛන සොයාගත හැකි වූයේද 2014 වර්ෂයේ සිටය. 2009 වර්ෂයේ අවසාන ගිණුම් ගොනුව පරීක්ෂා කිරීමේදී දක්නට ලැබුණේ 2008 වර්ෂයේ ණයහිමි ලෙස රුපියල් 3,705,029.57 ක ශේෂයක් තිබුණද මෙම කාලය තුළදී ද මෙවැනි ශේෂයන් ගෙවීමට නොපවතින බව සඳහන් කර ඇති ලිපියකි. එම ලිපියෙහි සඳහන් පරිදි දැනට පවතින ශේෂයට වඩා වැඩි ශේෂයක් පෙන්නුම් කරන අතර 2024 වර්ෂය දක්වා ද එම ශේෂයට කපා හැරීමක් සිදු නොවී ඇති බව ලෙජර් ගිණුම් පරීක්ෂා කර බැලීමේදී තහවුරු වේ. ඒ අනුව 2024 වර්ෂයට පවතින ශේෂයද දීර්ඝකාලීනව පැවත එන ශේෂයක් වන බැවින් එම ශේෂයන් සොයා ගැනීමට නොහැකි බැවින් හා මේ දක්වාම එම වටිනාකමට ණයහිමියෙකු මුදල් ඉල්ලා ඉදිරිපත් වී නොමැති බැවින්ද මෙම ශේෂය ගිණුම්වලින් ඉවත් කර ගෙන ණයහිමි උපලේඛණය නිවැරදි කර ගැනීමට කපා හැරීම සඳහා ඉදිරි අනුමැතියට යොමු කිරීමට මහ සභා අනුමැතියට ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම ශේෂයන්ට අදාළව ණය හිමියෝද, මුදල් ද නොමැති බවත්, ලෙජරවල සටහන් වීමක් පමණක් ඇති බවත්, එය ඉවත් කිරීමටයි යෝජනා කරන්නේ.

උදාහරණයක් ලෙස,

කර්මාන්තයකට මුදල් වෙන් වෙනවා රු1000.00 ක් නමුත් එම කර්මාන්තය රු800.00 සිදුකළ විට අපට රු200.00 ක මුදලක් ඉතිරි වෙනවා. එය ගෙවීමට ණය හිමියකු නොමැත. ඒ වගේ එකතු වූ මුදල් වටිනාකමක් ලෙජර ගිණුම් වල පවතින බවත්, කිසිදු ණය හිමියකු එම මුදල් ලබා ගැනීමට මෙතෙක් ඉදිරිපත් වී නොමැති බවත්, ඉදිරිපත් වීමට ණයහිමියකුද නොමැති බවත්, 2007 වර්ෂයේ සිට 2024 දක්වා පවතින එම සටහන් ඉවත් කිරීමට අපේක්ෂා කරන බව ප්‍රකාශ කරන ලදී.

තවද, ආදායමට එකතු කළ නොහැකි බවත්, එම අගය ලෙජරවල පැවතියත් පුද්ගලයකු හෝ මුදලක් නොමැති බව එය හුදෙක් අපේක්ෂිත අගයක් පමණක් බවත් ප්‍රකාශ කරන ලදී.

උදාහරණ:-

පළාත් සභා කර්මාන්තයකට රුපියල් ලක්ෂ 20 ක් වැය වේ යැයි අපේක්ෂා කළද එම ව්‍යාපෘතිය ලක්ෂ 15 න් නිම කළ විට අපට රුපියල් ලක්ෂ 05 ක ඉතිරියක් හිමිවේ. නමුත් අපට එම මුදල පළාත් සභාවෙන් නොලැබෙන්නා සේ මෙම අගයන්ද ලෙජරයේ පමණක් සටහන් වන්නක් බව ප්‍රකාශ කරන ලදී.

2007 සිට 2024 දක්වා එකතු වූ ලෙජර් ශේෂයක් පමණක් බවත්, ණයහිමියකු හෝ මුදලක් නොමැති බැවින් විගණන උපදෙස් මත මෙසේ ඉවත් කිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු 3,705,029.57 ක ශේෂය ගිණුම් වලින් ඉවත් කර ණයහිමි උපලේඛණය නිවැරදි කර ගැනීමට කපා හැරීම අනුමත කිරිම තීරණය විය.

vi. ප්‍රාදේශීය සභා රීති 3 පරිච්ඡේදය අංක 28 දරණ වගන්ති අනුව, මුදල් කවුන්ටරය පෙ:ව: 9.00 සිට ප:ව:1.00 දක්වා පමණක් ගනුදෙනු සඳහා විවෘතව තැබිය යුතුය. එහෙත් සේවා අවශ්‍යතාවය මත මුදල් කවුන්ටරය ප:ව: 3.30 දක්වා විවෘතව තැබීමට මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.
**තීරණය -**
මුදල් කවුන්ටරය පෙ:ව: 8.30 සිට ප:ව:3.30 දක්වා ගනුදෙනු සඳහා විවෘතව තැබීමට තීරණය විය.

vii. 2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරිම සඳහා පත්කරන ලද සමීක්ෂණ මණ්ඩලයට අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**2025 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය**

| | | |
|---|---|---|
| 01. ජේ.එම්.දීපානී වීරතුංග මිය | - | සභාපති |
| 02. එච්.ආර්.ඩබ්.පී.සම්පත් කුමාරි මිය | - | සාමාජික |
| 03. ඒ.ඩබ්.ජයරත්න මයා | - | සාමාජික |
| 04. එච්.ඒ.ආර්.එම්.ආර්.එල්.කේ.හෙට්ටිආරච්චි මිය | - | සාමාජික |
| 05. ආර්.ජේ.ඩබ්.එම්.ආර්.එල්.කේ.රාජකරුණා මිය | - | සාමාජික |
| 06. ආර්.ඒ.ඩී.ප්‍රේමරත්න මිය | - | සාමාජික |
| 07. එල්.කේ.එස්.ගුණතිලක මිය | - | සාමාජික |
| 08. යූ.ඒ.වී.එස්.බෝගහවත්ත මිය | - | සාමාජික |
| 09. ආර්.පී.එස්.ජයතිස්ස මිය | - | සාමාජික |
| 10. එච්.ඒ.එස්.ආර්.හේනකආරච්චි මිය | - | සාමාජික |
| 11. කේ.ජී.එස්.සී.ශානිකා අබේරත්න මිය | - | සාමාජික |
| 12. ඒ.ජී.ඒ.ප්‍රැන්සිස් මිය | - | සාමාජික |
| 13. පී.ඩී.චාන්දනී ජයරත්න මිය | - | සාමාජික |
| 14. ඩී.ආර්.එන්.කේ.ගුණරත්න මිය | - | සාමාජික |
| 15. ඒ.ඩී.එස්.එන්.ගුණසේකර මිය | - | සාමාජික |
| 16. එන්.එම්.ටී.එන්.සෙනෙවිරත්න මිය | - | සාමාජික |
| 17. ඒ.ජී.ආර්.එස්.ආර් ගමගේ මිය | - | සාමාජික |
| 18. ටී.ආර්.එන්.තාඹුගල මිය | - | සාමාජික |
| 19. වයි.එම්.අයි.කේ.යාපා බණ්ඩාර මිය | - | සාමාජික |
| 20. එන්.පී.එන්.අනුරාධා මිය | - | සාමාජික |
| 21. බී.එන්.එන්.ජයකොඩි මිය | - | සාමාජික |
| 22. කේ.ඒ.එස්.එන්.බණ්ඩාර මිය | - | සාමාජික |
| 23. ජී.ආර්.වයි.සමන් කුමාරි මිය | - | සාමාජික |

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2025 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා පත්කරන ලද ඉහත නම් සඳහන් නිලධාරීන් සුදුසු බවට අනුමත කිරීම තීරණය විය.

viii. කසල කළමණාකරන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2026 සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
කසල කළමනාකරණ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2026 මෙය පිටු විශාල ප්‍රමාණයක් අඩංගු පොතක් බවත්, විෂය නිලධාරිනිය ළඟ එය පවතින බවත්, එහි සංශෝධනය කිරීම් කිරීමට අවශ්‍ය නම් පරිසර කාරක සභාවේදී හෝ ඊළඟ සභා වාරයේදී හෝ සිදු කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**
Whats App Gruop එකකට හෝ Email එකකට දැමිය හැකි නම් වැදගත් බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
Whats App Gruop එකට එම සැලැස්ම යැවීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
කසල කළමණාකරන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2026 අනුමත කිරීම තීරණය විය.

ix. සභා අරමුදල් 2024 යටතේ ඉඹුල්ගස්දෙණිය මහජන පුස්තකාලයේ පඩි පෙළ ආවරණය සඳහා බිත්ති කොටසක් බැඳීම යන ව්‍යාපෘතියේ අතරැඳි මුදල වන රු.8,117.60 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමූපකාර සමිතියට ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.
තීරණය -
රු.8,117.60 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

x. රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශයේ සේවකයින් හට ලබාදීමට යෝජිත පුහුණු විමට අදාළ යෝජනාව 2025/09/02 දින පැවති මහ සභාවේ අංක (ඊ).01.(vii) යටතේ අනුමත වී ගරු ආණ්ඩුකාර අනුමැතිය ද ලබා ගෙන ඇති අතර එය සංශෝධනයට යෝජනා කරමි.

මෙම පුහුණුවේ දී ප්‍රායෝගික පුහුණුව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය තුළ දී ලබා දිමට සුදානම්ව තිබූ අතර මේ වන විට එම ව්‍යාපෘතියේ සිදුකරන සංවර්ධන කටයුතු සඳහා වසා දමා ඇති බැවින් රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශයේ සේවකයින් හට ලබාදීමට යෝජිත පුහුණුවිමේ වැඩසටහන සංශෝධනය කිරිමට සිදු වී ඇත.
ඒ අනුව මෙම පුහුණුවට අනුමත මුදල යටතේම පුහුණු වීමට අදාළ දේශන රඹුක්කන ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාවේදී පවත්වා ප්‍රායෝගික පුහුණුව සඳහා 2024 වර්ෂයේ කාර්යසාධන තරඟාවලියේ ප්‍රථම ස්ථානය ලබාගත් ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ කසල කළමණාකරන මධ්‍යස්ථානය තුළ දී පැවැත් වීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.09.02 මහ සභා යෝජනා අනුමැතිය ලැබී තිබෙන බවත්,ප්‍රාදේශීය සභා නීතිය අනුව මන්ත්‍රීවරුන් හයකගේ අත්සන් සහිතව එම යෝජනාව සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
පුහුණු සඳහා දේශනය රඹුක්කන ප්‍රාදේශීය සභාවේ පැවැත් විමටත්, ප්‍රායෝගික පුහුණු ගලිගමුව ප්‍රාදේශීය සභාවේ කසල කළමණාකරන මධ්‍යස්ථානය තුළ දී පැවැත් වීමටත් තීරණය විය.

xi. කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවයේ යොදවා ඇති පහත නම් සඳහන් සේවකයින් දෙදෙනාගේ ගිවිසුම් කාලය 2025.10.28 දින සිට 2026.01.28 දින දක්වා මාස 03 ක කාලයකින් දීර්ඝ කර ගැනීමටත් එම කාලය සඳහා ඔවුන් වෙත දෛනිකව රු.1,500.00 ක දීමනාවක් ගෙවීම් කිරීමටත් අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
  - ඒ ඩී ගුණරත්න මයා
  - ආර්.ඩී.එස්.ප්‍රදීප් කුමාර මයා

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කම්කරු හිඟය නිසා ගත් තීරණයක් බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පි.කේ.ධර්මසේන මැතිතුමා**

පෙර සිටි කම්කරුවන් නැවත බඳවා ගන්නේ නැතිද, අලුතින්ම බඳවා ගන්නවාද යන්න පිළිබඳව ප්‍රශ්න කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අලුතින්ම බඳවා ගන්නා බවත්, පරණ අයටත් අයදුම්පත් ලබාගෙන භාරදිය හැකි බවත්, අයදුම් පත් භාරගන්නා අවසාන දිනය දෙසැම්බර් 03 ලෙසත් ප්‍රකාශ කරන ලදී. අනූෂා මහත්මිය මේ සම්බන්ධ කටයුතු කරන බවත්, මන්ත්‍රීවරුන් දන්නා අය සිටී නම් එතුමිය වෙත යොමු කර අයදුම්පත් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

**ඉහත නම් සඳහන් සේවකයින් දෙදෙනාගේ ගිවිසුම් කාලය 2025.10.28 දින සිට 2026.01.28 දින දක්වා මාස 03 ක කාලයකින් දීර්ඝ කිරීමටත්, එම කාල සීමාව සඳහා ඔවුන් වෙත දෛනිකව රු.1,500.00 ක දීමනාවක් ගෙවීම් කිරීමටත් තීරණය විය.**

xii. මෙම සභාවේ පුරප්පාඩුව පවතින ආයුර්වේද වෛද්‍ය නිලධාරී තනතුර සඳහා විශ්‍රාමික ආයුර්වේද වෛද්‍ය නිලධාරී බී.ඒ.ජී.සී.අභයවර්ධන මහත්මිය කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

යෝජනාවට විරුද්ධත්වයක් නොමැති බවත්, දැනට මෙහි සිටින ආයුර්වේද වෛද්‍යවරිය කැඩුම් බිඳුම් සම්බන්ධව හොඳ පරපුරුද්දක් ඇති බැවින් එතුමිය මෙහි රඳවා ගැනීම ඉතා සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එතුමියගේ ඉල්ලීම ලැබුණ විට ඇයට සේවා ස්ථානය ලෙස ලැබෙනුයේ හේවාදීවල ආයුර්වේද මධ්‍යස්ථානය බව දන්නා සිටි බව ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

**විශ්‍රාමික ආයුර්වේද වෛද්‍ය නිලධාරී බී.ඒ.ජී.සී.අභයවර්ධන මහත්මිය කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගැනීමට තීරණය විය.**

xiii. රඹුක්කන ප්‍රාදේශීය සභාවේ පවතින ස්ථාවර තැන්පත් ගිණුම ආයෝජනය කළ මුදල් යොදා ගැනීමේ පදනම මත ඉදිකිරීම් ආරම්භ කර ඇති නව ශ්‍රවණාගාර සංකීර්ණය සඳහා මේ වන විට ලැබී ඇති බිල්පත් වටිනාකම වන රු. 29,296,721.82 ( දෙකෝටි අනූ දෙලක්ෂ අනූ හය දහස් හත්සිය විසි එකයි සත අසූ දෙක) ක් හා මෙම වර්ෂයේ ඉදිරි දින වලදී ලැබීමට නියමිත බිල්පත් වටිනාකම වන රු.12,000,000.00 ක් ලෙස සලකා ඒ අනුව ඇස්තමේන්තු වියදම ලෙස රු.42,000,000.00 ක මුදලක් කල්පිරීමට ආසන්න ස්ථාවර තැන්පත්

ගිණුමෙන් ලබා ගැනීමටත්, එහිදී අභිමිවන ආයෝජන පොලිය එම ශ්‍රවණාගාරය තුළින් ලැබෙන ප්‍රතිලාභ සඳහා සාධාරණීකරණය වාර්තාවක් සකස් කර ගරු ආණ්ඩුකාර තුමියගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව මහ සභා අනුමැතිය ලබා ගැනිම ද සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පි.කේ.ධර්මසේන මැතිතුමා**

ස්ථාවර තැන්පතුව පදනම් කරගෙන ණය මුදලකට යාම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ස්ථාවර තැන්පතුව ඇපයට තබා ණය මුදලකට යා හැකි බව දන්නා නමුත් මෙම ප්‍රජාශාලාව ඉදිකිරීමට අනුමැතිය ලබාගෙන ඇත්තේ අපේ දැනට පවතින ස්ථාවර තැන්පතු මුදල් යොදාගෙන බැවින් ණය මුදලකට යා නොහැකි බව ප්‍රකාශ කරන ලදී. අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අභිමිවන ආයෝජන පොලිය එම ශ්‍රවණාගාරය තුළින් ලැබෙන ප්‍රතිලාභ සඳහා සාධාරණීකරණය වාර්තාවක් සකස් කර ගරු ආණ්ඩුකාර තුමියගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට තීරණය විය.

xiv. රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු RE-2261 ට්‍රැක්ටර් රථයේ ක්ලච් පද්ධතිය හා බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියා කළ අතර එහි ස්ටාටර් මෝටරය සහ රියදුරු අසුන ද අළුත්වැඩියා කරන ලදී. එම අළුත්වැඩියාව වෙනුවෙන් රු.208,500.00 ක මුදලක් මීදුම, මිහිඳුපුර, තරිඳු මෝටර්ස් ආයතනය වෙත ඒ නමින් ගෙවීමට අවශ්‍ය මහ සභා අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි. (බිල් අංක 11, දිනය 2025.10.09)

සැ.යු:

- ලියාපදිංචි හා සුදුසුකම් ලත් ආයතනයක් වන තරිඳු මෝටර්ස් වෙතින් ලබා ගත් මිල ඇස්තමේන්තුව 2025.08.05 මහ සභාවේ ඊ.1.(xii) තීරණය මඟින් අනුමත වී ඇත.
- අළුත්වැඩියාවට පෙර හා පසු ඉංජිනේරු වාර්තා අමුණා ඇත.
- මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවේ අනුමැතිය.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පසුගිය සභා වාරයේදී ඉදිරිපත් වී මුදල් කමිටුවට යා යුතු බව දන්වා න්‍යාය පත්‍රයෙන් ඉවත් කරන ලද යෝජනාව වන බවත්, මෙය මුදල් කමිටුවට ඉදිරිපත් කළ බවත්, එහිදී එය සාකච්ඡාවට භාජනය වූ බවත්, ගෙවීම් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු.208,500.00 ක මුදල මීදුම, මිහිදුපුර, තරිඳු මෝටර්ස් ආයතනය වෙත ගෙවීම් කිරිමට තීරණය විය.

xv. 2025.11.01 දින සිට 2025.11.21 දින දක්වා රඹුක්කන ප්‍රාදේශීය සභාවේ වියදම් පිළිබඳ වාර්තාව මහ සභා අනුමැතියට යෝජනා කරමි.

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2025.11.06 | 1210 | සභාපති, ප්‍රාදේශිය සභාව ,රඹුක්කන | 2025.10.21 දින පවත්වන ලද සැලසුම් කමිටු සඳහා දීමනාව ගෙවීම | 18,000.00 |
| | 1211 | සභාපති, ප්‍රාදේශිය සභාව ,රඹුක්කන | 2025.08.22,23,24 යන දින වල බතඹුරය ක්‍රීඩාංගනයේ පවත්වන ලද සැණකෙළිය සඳහා ගෙවන ලද ඇප මුදල් ආදායමට ගැනිම | 60,000.00 |
| | 1212 | දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් | 2025.07.01 දින සිට 2025.09.30 දින දක්වා තුන් වන කාර්තුවට අදාල මුද්දර බදු ගෙවීම | 87,935.00 |
| | 1213 | සභාපති, ප්‍රාදේශිය සභාව ,රඹුක්කන | සභාව සතු ට්‍රැක්ටර් 04 සහ ටේලර් 04 සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ලබා ගැනීම | 13,200.00 |
| 2025.11.07 | 1214 | ජය සංඛ වැඩිහිටි සමිතිය | මිලි මාවත සංවර්ධනය කිරිම - රැඳවුම් මුදල් ආපසු ගෙවීම | 29,075.00 |
| | 1215 | ගොඩගන්දෙණිය ග්‍රාම සංවර්ධන සමිතිය | මුවපිටිය ගොඩගන්දෙණිය මාර්ගය සංවර්ධනය කිරීම - රැඳවුම් මුදල් ගෙවීම | 82,245.00 |
| 2025.11.10 | 1216 | කේ.ඒ.එස්.ඩී. කළුආරච්චි | කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවූ කාර්මික නිලධාරි කේ.ඒ.එස්.ඩී.කලුආරච්චි මහතාගේ ඔක්තෝම්බර් මස දිමනා ගෙවිම | 63,300.00 |
| | 1217 | සභාපති, ප්‍රාදේශිය සභාව ,රඹුක්කන | 2025 ඔක්තෝම්බර් මස අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියට අදාළ කම්කරු වැටුප් ගෙවීම | 90,720.00 |
| 2025.11.11 | 1218 | සභාපති, ප්‍රාදේශිය සභාව ,රඹුක්කන | 2025 ඔතෝම්බර් මස මන්ත්‍රී සභික දීමනාව ගෙවීම | 570,000.00 |
| | 1219 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර ගාස්තු අලුත් කිරීම | 30,000.00 |
| | 1220 | විවිධ සේවා සමුපකාර සමිතිය-රඹුක්කන | 2025 සැප්තැම්බර් මාසයට අදාළ ධාවනය වු වාහන, තණ කොළ කපන මැෂින් සඳහා ඉන්ධන බිල්පත් ගෙවීම | 610,880.50 |
| | 1221 | ලංකා විදුලි බල මණ්ඩලය | 2025 සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මසට අදාළ විදුලි බිල්පත් ගෙවීම | 45,068.28 |
| | 1222 | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය - කුරුණෑගල | 2025.09.06 සිට 2025.10.07 දක්වා ඉඹුල්ගස්දෙනිය පුස්තකාල ජල බිල්පත ගෙවීම | 1,298.00 |
| | 1223 | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය -කෑගල්ල | 2025 සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මස ජල බිල්පත් ගෙවීම | 103,371.01 |

| | | | | |
|---|---|---|---|---|
| | 1224 | සද්ධා සංකල්ප වැඩිහිටි සමිතිය | බංගලාවත්ත පළමු පටුමඟ කාණු පද්ධතිය සකස් කිරීම - රඳවුම් මුදල් ගෙවීම | 48,475.00 |
| | 1225 | ද ඇසෝසියේටඩ් නිවුස්පේපර් ඔෆ් සිලෝන් ලිමිටඩ් | පළාත් සභා කර්මාන්ත හා මධ්‍යම රජයේ කර්මාන්ත ප්‍රසම්පාදනය සඳහා පුවත්පත් දැන්වීම් ගාස්තු ගෙවීම | 93,456.00 |
| | 1226 | සභාපති, ප්‍රාදේශිය සභාව ,රඹුක්කන | 2025 ජුලි මස ගලි තැන්පතු ආදායමට ගැනිම | 289,150.00 |
| | 1227 | ඩී.ආර්.ආර්.සාලින්ද කුමාර | අතිකාල දීමනා ගෙවීම | 11,537.03 |
| | 1228 | ටී.එම්.ටී.බී.තෙන්නකෝන් | ගමන් වියදම් ගෙවීම | 610.00 |
| | 1229 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 2025 අගෝස්තු මසට අදාළ ආයතන නිලධාරීන් ලබා ගන්නා ලද දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම | 79,200.00 |
| | 1230 | රංජනි බේක් හවුස් | 2025.10.01 ලෝක ළමා දින වැඩසටහන සඳහා සංග්‍රහ වියදම සඳහා ගෙවීම | 11,100.00 |
| | 1231 | එස්.එම්.කේ.බී. සමරකෝන් | ළමා උද්‍යානය අලුත් වැඩියාව සඳහා ඇණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 190.00 |
| | 1232 | සි/ස ලංකා ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාව | පොළ භූමියේ ළමා උද්‍යානය අලුත් වැඩියා කටයුතු සඳහා සිමෙන්ති ලබා ගැනීම | 14,000.00 |
| | 1233 | එල්.එච්.චන්ද්‍රසේකර බ්‍රදර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 40,308.85 |
| | 1234 | තිලක හාඩ්වෙයාර් | පොළ භූමියේ ළමා උද්‍යානය අලුත් වැඩියා කටයුතු සඳහා ටිනර් සහ ෂටරින් ලෑලි සැපයිම වෙනුවෙන් ගෙවීම | 3,750.00 |
| | 1235 | තිලක හාඩ්වෙයාර් | රඹුක්කන සහ දැලිවල පෙර පාසල් සඳහා තීනිත ආලේප කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 20,600.00 |
| | 1236 | ජගත් ගොඩ නැඟිලි ද්‍රව්‍ය සපයන්නෝ | ළමා උද්‍යානය අලුත් වැඩියාව සඳහා කළු ගල් සැපයිම වෙනුවෙන් ගෙවීම | 6,200.00 |
| | 1237 | බී.ඩී.ඩී. මදාරා | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 1238 | ඩබ්.එච්. එස්. බී. චන්ද්‍රසේන | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 16,977.93 |
| | 1239 | කෑගලු දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 1,821.61 |
| | 1240 | ආර්.පී.සී.අයි.එම්. ප්‍රේමරත්න | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 18,080.37 |
| | 1241 | ආර්.පී. එල්. ඩබ්. රණසිංහ | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 850.54 |
| | 1242 | එන්.එම්.එම්. අබේසේකර | ගලි බවුසරය වෙන් කිරිම සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 7,875.00 |
| | 1243 | සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය | රඹුක්කන පශු වෛද්‍ය කාර්යාලයේ රුදවුම් බැම්ම සහ වැට අලුත් වැඩියා කිරීම කර්මාන්තයේ අවසන් බිල්පත් ගාස්තු ගෙවීම | 1,738,670.37 |

| | | | | |
|---|---|---|---|---|
| | 1244 | සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය | කොම්පෝස්ට් අංගනයේ ජල ටැංකිය ඉදිරිපිට SWS - 2413701 ව්‍යාපෘතියේ අවසන් බිලිපත් ගාස්තු ගෙවීම | 742,703.81 |
| | 1245 | එස්.ජේ.එස්. සමරසිංහ | අතිකාල දීමනා ගෙවීම | 21,543.33 |
| | 1246 | පී.ජී.එස්. කුමාරි | අතිකාල දීමනා ගෙවීම | 5,462.08 |
| | 1247 | ඩබ්.නලින් පුෂ්ප කුමාර | අතිකාල දීමනා ගෙවීම | 5,710.00 |
| | 1248 | බී.වි. සිසිර | අතිකාල දීමනා ගෙවීම | 2,894.00 |
| | 1249 | ජී.ආර්.වයි.සමන් කුමාරි | අතිකාල දීමනා ගෙවීම | 2,996.00 |
| | 1250 | ඩබ්.ජී.එල්.සුබසිංහ | අතිකාල දීමනා ගෙවීම | 2,022.50 |
| | 1251 | එම්.එන්.පද්මසිරි | අතිකාල දීමනා ගෙවීම | 7,407.00 |
| | 1252 | එම්.ජී. අජිත් ප්‍රියන්ත කුමාර | අතිකාල දීමනා ගෙවීම | 7,266.00 |
| | 1553 | එම්.ජී. ඒ.කේ. මැදවත්ත | අතිකාල දීමනා ගෙවීම | 11,985.00 |
| | 1254 | ඩී.පී.ජී. ආරියරත්න | අතිකාල දීමනා ගෙවීම | 3,548.47 |
| | 1255 | බී.ඒ.අසංක හංස කුමාර | අතිකාල දීමනා ගෙවීම | 1,749.61 |
| | 1256 | බී.ඒ.අසංක හංස කුමාර | අතිකාල දීමනා ගෙවීම | 6,148.22 |
| | 1257 | ඩී.ඩබ්.ජී.ඒ.සඳරුවන් | අතිකාල දීමනා ගෙවීම | 4,074.07 |
| | 1258 | එස්.ඩබ්. එස්. ශ්‍රියානන්ද | අතිකාල දීමනා ගෙවීම | 2,888.89 |
| | 1259 | වී.ඒ.එස්. ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 1,817.78 |
| | 1260 | එස්.එන් නන්ද ශ්‍රී | අතිකාල දීමනා ගෙවීම | 5,604.81 |
| | 1261 | එච්.ඩබ්.ඒ.අයි.එල් වීරකෝන් | අතිකාල දීමනා ගෙවීම | 7,574.07 |
| | 1262 | ජේ.එන්.එල්.ජයසිංහ | අතිකාල දීමනා ගෙවීම | 7,574.07 |
| | 1263 | එස්.ඩබ්.පී. ධර්මසේන | අතිකාල දීමනා ගෙවීම | 7,671.10 |
| | 1264 | පී.ගීත් ප්‍රේමශ්‍රී | අතිකාල දීමනා ගෙවීම | 7,251.85 |
| | 1265 | ජී.ඒ.බන්දුසේන | අතිකාල දීමනා ගෙවීම | 8,331.48 |
| | 1266 | ජී.ජී.බී.ඒ. කුමාර් | අතිකාල දීමනා ගෙවීම | 8,520.89 |
| | 1267 | එස්.ඩබ්.සී.එස්.නන්දන | අතිකාල දීමනා ගෙවීම | 9,409.81 |
| | 1268 | එච්.ඒ.සී.එල්.පියසේන | අතිකාල දීමනා ගෙවීම | 16,762.28 |
| | 1269 | ඩබ්.ඩී.එස්.කේ.පියතිලක | අතිකාල දීමනා ගෙවීම | 3,758.00 |
| | 1270 | ඩබ්.ඩබ්.ඩී.වීරක්කොඩි | අතිකාල දීමනා ගෙවීම | 16,687.50 |
| | 1271 | එච්.සී.කේ. හෙට්ටිගොඩ | අතිකාල දීමනා ගෙවීම | 17,344.62 |
| | 1272 | කේ.ජී. ධනුක ශ්‍රීමාල් | අතිකාල දීමනා ගෙවීම | 7,865.27 |
| | 1273 | ඩබ්.ඩබ්.ඩී.වීරක්කොඩි | ගමන් වියදම් ගෙවීම | 4,200.00 |
| | 1274 | එන්.ටී.ආර්.ප්‍රේමසිරි | ගමන් වියදම් ගෙවීම | 4,200.00 |
| | 1275 | ඩබ්.ඩී.එස්.කේ.පියතිලක | ගමන් වියදම් ගෙවීම | 4,200.00 |
| | 1276 | කේ.ඒ.එස්.ඩී. කළුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 1277 | කේ.ඒ.එස්.ඩී. කළුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 1278 | කේ.ඒ.එස්.ඩී. කළුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 1279 | ඩබ්.දිමන්ත සංජීව කුමාර | ගමන් වියදම් ගෙවීම | 993.60 |
| | 1280 | ඩබ්.දිමන්ත සංජීව කුමාර | ගමන් වියදම් ගෙවීම | 535.44 |
| | 1281 | ඩබ්.දිමන්ත සංජීව කුමාර | ගමන් වියදම් ගෙවීම | 1,639.44 |
| | 1282 | එස්.ජේ.එස්. සමරසිංහ | ගමන් වියදම් ගෙවීම | 3,600.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1283 | එස්.ජේ.එස්. සමරසිංහ | ගමන් වියදම් ගෙවීම | 784.00 |
| | 1284 | එච්.ඒ.එස්.ආර්.හේනකආරච්චි | ගමන් වියදම් ගෙවීම | 714.00 |
| | 1285 | ඩී.ජී.සී.ඩී.එස්.කුමාරි | ගමන් වියදම් ගෙවීම | 714.00 |
| | 1286 | එල්.කේ.එස්.ගුණතිලක | ගමන් වියදම් ගෙවීම | 714.00 |
| | 1287 | එච්.ආර්.ඩබ්.පී.සම්පත් කුමාරි | නිවාඩු දින වැටුප් ගෙවීම | 2,884.66 |
| | 1288 | එච්.ආර්.ඩබ්.පී.සම්පත් කුමාරි | නිවාඩු දින වැටුප් ගෙවීම | 8,654.00 |
| | 1289 | ආර්.ජී.එස්. නිරෝෂන් | නිවාඩු දින වැටුප් ගෙවීම | 10,284.00 |
| | 1290 | ආර්.ජී.එස්. නිරෝෂන් | නිවාඩු දින වැටුප් ගෙවීම | 10,284.00 |
| | 1291 | ද ඇසෝසියේටඩ් නිවුස් පේපර් ඔෆ් සිලෝන් ලිමිඩට් | 2026 වර්ෂයට සභාවේ දේපල බදු දිමේ ප්‍රසම්පාදන දැන්වීම් පුවත්පතේ පල කිරිමට අදාල ගාස්තු ගෙවිම | 38,232.00 |
| | 1292 | මධ්‍යම පරිසර අධිකාරිය | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ පරිසර ආරක්ෂණ බලපත්‍රය අලුත් කීරීම සඳහා ලාස්තු ගෙවිම | 5,240.83 |
| 2025.11.20 | 1293 | නාමල් සර්විස් සෙන්ටර් | LLෆෝටෝන් කැබ් රථය ඔයිල් අල්ලා සේදිම සඳහා ගෙවිම | 4,200.00 |
| | 1294 | සභාපති, ප්‍රාදේශිය සභාව , රඹුක්කන | තැන්පත් ලේඛනයේ මිශ්‍ර තැන්පතු ආදායමට ගැනිම | 170,000.00 |
| | 1295 | සභාපති, ප්‍රාදේශිය සභාව , රඹුක්කන | 2025.10.16 දින කාර්යාල ක්‍රම සහ ගිණුම් ක්‍රම පුහුණුව සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල් ලියවිම | 16,280.00 |
| | 1296 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ජෙනරල් ලිමිටඩ් | H.M.T.ට්‍රැක්ටර් ටේලරයේ පූර්ණ රක්ෂණාවරනය සිදු කිරීම | 2,084.16 |
| 2025.11.21 | 1297 | සභාපති, ප්‍රාදේශිය සභාව , රඹුක්කන | 2025.නොවැම්බර් මස සේවක වැටුප් ගෙවීම | 7,401,473.80 |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2025.11.01 දින සිට 2025.11.21 දින දක්වා උපලේඛන අංක 01 හි සඳහන් වියදම් දැරීම සුදුසු බව තීරණය විය.

**(ඊ).02.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

i. ඉඹුල්ගස්දෙනියේ වසම තුළ පිහිටා ඇති ඉඹුල්ගස්දෙණිය වැව ප්‍රතිසංස්කරණය කර ප්‍රදේශයේ ජනතාවට හා ප්‍රාදේශීය සභාවට එලදායී ලෙස සකස් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

මේ වන විට විශාල මුදලක් වැය කරමින් මාර්ග සංවර්ධනයක් සිදුකරමින් පවතින බවත්, ඉඹුල්ගස්දෙණිය වසමේ පිහිටි මෙම වැව ඉතා විශාල වැවක් බවත්, වැසි කාලයට අධික ජල ධාරිතාවක් ගබඩා කර තබා ගැනීමේ හැකියාවක් එහි පවතින බවත්, එම වැව ප්‍රතිසංස්කරණය කිරීමට හැකියාව ලැබුණහොත් ප්‍රදේශයේ ජනතාවට මෙන්ම සභාවක් හැටියට අපටද ප්‍රතිලාභ ලබාගත හැකි බව ඔහුගේ අදහස බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පනතට අනුව වැව්, පොකුණු ආදිය ප්‍රතිසංස්කරණය කිරීමට සභාවකට කළ නොහැකි බවත්, එය පනතට පටහැනි බවත්, එමඟින් අධිභාරයකට ලක්වන බවත්, එය අදාළ අමාත්‍යාංශයට යොමු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

තෙන්නකෝන් මන්ත්‍රීතුමාගේ අදහසට එකඟවන බවත්, ජයවීර මැතිතුමාගේ ප්‍රදේශය සංවර්ධනය කිරීමට එතුමාට උනන්දුව, උත්සාහය පවතින බවත්, එය ඉතා අගය කොට සලකන බවත්, ඔබතුමන්ලාගේ ආණ්ඩුව පවතින බැවින් ලිඛිතව එම අමාත්‍යාංශයන්ට දන්වා මෙම කාර්යය සිදු කර ගැනීම අපහසු නොවන බවත්, මෙතුමාගේ යෝජනාව න්‍යාය පත්‍රයට දැමීම මගින් සභා වාර්තාව ඒකමතිකව සම්මත විය යන්න යෙදීමටද ගැටලුවක් පවතින බවත්, පාර්ලිමේන්තු මන්ත්‍රී හා අදාළ සම්බන්ධීකරණ ලේකම් හරහා අදාළ අමාත්‍යාංශ දැනුවත් කිරීම මගින් මෙය සිදු කර ගත හැකි බවත් අදාළ යෝජනා සභා වපසරිය මත පමණක් භාරගෙන අනෙකුත් යෝජනා ඔබතුමන්ලාගේ බලතල භාවිතා කර න්‍යාය පත්‍රයට ඇතුළත් නොකර සිටීමට කටයුතු කරන ලෙසත්, එමඟින් අනවශ්‍ය විවාද ඇති වී කාලය අපතේ යන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පි.කේ.ධර්මසේන මැතිතුමා**

ජයවීර මන්ත්‍රීතුමාගේ මෙම යෝජනාව ඉතා හොඳ බවත් එමඟින් එම ප්‍රදේශයේ සංවර්ධනය කිරීමක් අපේක්ෂා කළ හැකි බවත් එතුමාගේ එම යෝජනාව අදාළ වාරි මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව හා එක්ව සංවර්ධනය කිරීමට යන සංශෝධනයත් සමඟ ඉදිරිපත් කිරීම සුදුසු බව සභාවක් හැටියට පනතේ මේ සම්බන්ධව මොනයම් හෝ ආකාරයකින් ප්‍රතිපාදන වෙන් කිරීමේ හැකියාවක් පවතීද යන්න පිළිබඳව සොයා බලා කටයුතු කිරීමට හැකියාව පවතින බවත් යෝජනාව ක්‍රියාත්මක කිරීමට විරුද්ධත්වයක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

සමීර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අදහසින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, කාලය කළමනාකරණය කරගත යුතු බැවින් සුදුසු තීරණයක් ගන්නා මෙන් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා වෙලා ඔබතුමන්ලා මෙතැනට ඇවිත් තිබෙන්නේ තම බල ප්‍රදේශයට මොනයම් හෝ දෙයක් සිදුකර තම ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට අවශ්‍යය සංවර්ධන කටයුතු සිදුකිරීමට බවත්, පොදු දේපළ සංවර්ධනය කිරීමෙන් කිසියම් හෝ දිනෙක අපගේ යෝජනාවක් ක්‍රියාත්මක වීම ගැන අපට සතුටු විය හැකි බවත්, එම අරමුණකින් මේ යෝජනාව ඉදිරිපත් කිරීමට ඇති බව, සිතා න්‍යාය පත්‍රයට මෙය ඇතුළත් කළ බවත්, යෝජනාව භාර ගෙන සම්බන්ධීකරණ කමිටුව හරහා සභාවේ මැදිහත්වීම මත මෙහි අවශ්‍ය කටයුතු සිදුකිරීමට ක්‍රියාමාර්ග ගැනීමටත්, සභාවේ ප්‍රතිපාදන නොමැති බැවින් හා ආදායම් උත්පාදනයට යා හැකි බැවිනුත් ප්‍රදේශයේ සංවර්ධනයටද ඉහළ දායකත්වයක් ලබා ගත හැකි බැවිනුත් මෙම යෝජනාව ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ආයතන දැනුවත් කරමින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
යෝජනාව ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ආයතන දැනුවත් කරමින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය.

**(ඊ).03.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

i. කවුඩා උල්ල වසම සහ කෝංගස්ගොඩැල්ල නිවාස ආශ්‍රිත කානු පද්ධතිය පිළිසකර කිරීම (වර්ෂා කාලයට ඉහලින් එන ජලය නිසා නිවාස කිහිපයක්ම යටවීමේ තත්ත්වයක් ඇත.) සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

මෙම ප්‍රදේශය කඳුකර බෑවුම් සහිත ප්‍රදේශයක් බවත් ජලය ක්‍රමවත් ආකාරයට බැහැර යන ආකාරයට කාණු පද්ධතියක් නොමැති බවත් පැරණි නිවාස කිහිපයක් පවතින බවත් වර්ෂා කාලයේ දී ජලය ක්‍රමවත්ව කාණු පද්ධතියක් හරහා ගලා නොයන බැවින් නිවාස 02/03 ට ජලයෙන් හානි සිදුවන බවත් නාය යෑම් තත්ත්වයන්ට මුහුණ දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
කාණු පද්ධතිය පිළිසකර කිරීම ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

ii. හරන්කහවත්ත ( කුඹල්ඔළුව වසම) සියලු ජල පාරවල් බැස යන පතුල කැඩී ඇති කාණු පද්ධතිය පිළිසකර කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

ලක්ෂ 20 ක පළාත් සභා ප්‍රතිපාදන වෙන් කරගෙන මෙම කුඹල්ඔළුව වසමේ මාර්ග සංවර්ධනය කළ බවත්, වර්ෂා කාලයේදී කාණු පද්ධතිය මඟින් එන ජල ප්‍රමාණය අධික බැවින් පිටාර යන බවත්, නිවාස කිහිපයකටද මෙමඟින්ද හානි සිදු වන නිසාත්, හැකි ඉක්මනින් මෙම මාර්ගයේ කාණු පද්ධතිය පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
මාර්ග වල ජලය බැස යන පතුල කැඩී ඇති කාණු පද්ධති පිළිසකර කිරීමට තීරණය විය.

iii. කුඹල්ඔළුව වසම දොලොල්ලහ කුඹුරු ප්‍රධාන ඇළ පිළිසකර කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

කුඹුරු වගාව සඳහා භාවිතා කරන ප්‍රධාන ඇල මාර්ගය මෙය වන බවත්, එය පිළිසකර කරදීම ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගොවිජන සේවා මධ්‍යස්ථානයට යොමු කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත යොමු කිරීමට තීරණය විය.

iv. කුඹල්ඔලුව වසම රෝහණ වීරසිංහ මහතාගේ නිවස අසල ඇති අධික බෑවුම් සහිත මාර්ගයේ කැඩී ඇති පැති බැම්ම පිළිසකර කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

මෙම ප්‍රදේශය අධික බෑවුම් සහිත අනතුරුදායක ප්‍රදේශයක් බවත්, මෙහි කාණු පද්ධතිය පිළිසකර කරගැනීමට ප්‍රතිපාදනය වෙන් කරගෙන පවතින බවත්, එම ප්‍රතිපාදන ප්‍රමාණය පැතිබැම්ම ඉදිකිරීමට හා කාණු පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා වන ප්‍රමාණවත් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

පැති බැම්ම පිළිසකර කිරීමට තීරණය විය.

**(ඊ).04.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

**i.** මෙවර අ.පො.ස(සා.පෙළ) විභාගයට පෙනී සිටින සිසුන් වෙනුවෙන් සියලු විෂයන් ආවරණය වන පරිදි නොමිලේ සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී

ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

රටේ පවතින ව්‍යසනකාරි තත්වයට පෙරාතුරුව ඉදිරිපත් කළ මෙම යෝජනාව මේ වන විට ඉතා වටිනාකමක් ඇති යෝජනාවක් බව හැඟෙන අතර පසුගිය අයවැය මඟින් ද යම්ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වී ඇති බවත්, පීඩාවට පත්ව සිටින සිසුන්ට මෙවැනි සම්මන්ත්‍රණමාලාවක් ලබා දීමට හැකි වීම ආර්ථික වශයෙනුත් මානසික අතිනුත් සහනයක් සැලසෙන බවත්, උප සභාපතිතුමාගේ සම්පත්දායකත්වය හා ඔහුගේ මිතුරන් කිහිප දෙනෙකුගේ ද සම්පත්දායකත්වයද ලබා ගැනිමට හැකි බැවින් සභාව මැදිහත් වී මෙම වැඩසටහන ක්‍රියාවට නන්වමුයි යෝජනා කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

මෙවර අ.පො.ස(සා.පෙළ) විභාගයට පෙනි සිටින සිසුන් වෙනුවෙන් සියලු විෂයන් ආවරණය වන පරිදි නොමිලේ සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්විම තීරණය විය.

**(ඊ).05.** ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා

i. රඹුක්කන ආසනය ආවරණය වන පරිදි නාට්‍ය තරඟාවලියක් පැවැත්විම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

පවතින ආපදා තත්ත්වය සමග මෙම යෝජනාව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි බව දන්නා නමුත් ලබන වසරේ වෙසක් පොහොය නිමිති කරගෙන මෙම යෝජනාව ක්‍රියාවට නැංවිය හැකිනම් ඉතා අගය කොට සලකන බවත්, ප්‍රදේශයේ සිටින සැඟවුණ දක්ෂතා ඇති දරුවන්ගේ එම දක්ෂතා ඉදිරියට ගැනිමට සභාවක් හැටියට අපට හැකියාවක් පවතින බවත්, මෙය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

හරියට කාලය තීරණය කළ නොහැකි බවත්, ඉදිරි වසරේ සාහිත්‍ය මාසය ඉලක්ක කර මෙය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රඹුක්කන ආසනය ආවරණය වන පරිදි නාට්‍ය තරඟාවලියක් ලබන වසරේ සාහිත්‍ය මාසය ඉලක්ක කර පැවැත්විම සඳහා සලකා බැලිමට තීරණය විය.

ii. රඹුක්කන ආසනය තුළ ඇති සියලුම මාර්ගවල මාර්ග සීමාවේ ඇති සියලුම මල් පැළ හා වගාවන් ඉවත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

රඹුක්කන කොට්ඨාශයේ පවතින බොහෝ මාර්ගවල මාර්ගය දෙපස මල්පැළ සිටුවීම මඟින් මාර්ගයේ ගමන් කරන වාහන වලට ඉදිරියෙන් එන වාහන පිළිබඳ අවබෝධයක් ලබාගත නොහැකි බවත්, එමඟින් මාර්ග අනතුරු බොහොමයකට ඉඩකඩ ඇති බවත්, පසුගිය දවසක පින්නවල මාර්ගයේ ගසක් කඩා වැටී අපි මැදිහත් වී ඉවත් කළ බවත්, මාර්ගය අලංකාරයට හෝ සෙවන සඳහා ශාක සිටුවනවානම් නිසි නඩත්තුවකින් එය පවත්වාගෙන යා යුතු බවත්, මාර්ග නඩත්තුව සභාවට අයත් නොවුණත් එම ආයතන හා එක්ව සියලුම මාර්ගවල පවතින ශාක ඉවත් කිරිමට කටයුතු කරමු ලෙසත්,ග්‍රාමීය මාර්ගවල සභාව මැදිහත් වී අනවසර වගාකිරීම් ඉවත් කිරිමට කටයුතු සිදු කරමුයි ප්‍රකාශ කරන ලද අතර මෙම ව්‍යසනකාරි තත්වය හමුවේ මේවන විට මාර්ග පිළිසකර කිරීම් වල නිරත වන බැවින් මෙය ක්‍රියාවට නැංවීමට හැකියාව පවති නම් එය වටිනා බව තවදුරටත් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

කාලෝචිත හොඳ යෝජනාවක් බව ප්‍රකාශ කරන ලදී. ඔහුගේ කොට්ඨාශයෙත් මෙවැනි අනවසර වගා කිරීම් පවතින බවත්, ශ්‍රමදාන මට්ටමින් වත් එවා ඉවත් කිරීමට නොහැකි බවත්, බොහෝ කාලයක් ලිපි එහාට මෙහාට හුවමාරු වෙමින් පැවති කිරිවල්ලාපිටියේ පිහිටි විශාල මාර ගසක් ඊයේ ඉවත් කිරීමට කටයුතු කළ බවත්, චක්‍රලේඛවලින් එහාට ගොස් මෙම ව්‍යසනකාරි තත්වය හමුවේ කිරිවල්ලාපිටියේ හා කන්සලගමුවේ පාරේ තිබෙන ගස් ඉවත් කිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

කෝන්ගස්හන්දියේ පවතින කොට්ටම්බා ගස සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ ඉවත් කිරීමට කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

සමීර මන්ත්‍රීතුමාගේ යෝජනාව කාලෝචිත බවත්, මෙසේ මල්වැටවල් පවතින විට කාණු පද්ධතියට අවහිරතා ඇති වන බව නිරීක්ෂණවලදී දැක ගැනිමට හැකි වු බවත්, සභා පාරවල් වල තාප්ප බැද මල් වැටවල් ගහවැරැල්ල වැනි පොළවට මුල් කා වදින ශාක සිටුවා ඇති බවත්, මෙම ආපදාතත්ත්වය උපයෝගී කරගෙන මෙතුමාගේ යෝජනාව සම්මත කරගෙන හැකි ඉක්මනින් මෙම අනවසර වගාවන් ඉවත් කිරිම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සමීර මන්ත්‍රීතුමාගේ යෝජනාව කාලෝචිත බවත්,පාරවල් වසා ගෙන මල් පමණක් නොව කෙසෙල් ද වගාකර ඇති බවත්, ජලය බැස යාමට කාණු පද්ධතිය අවහිර වී ඇති බවත්,වාහන මාරුවීමට අපහසුතත්ත්වයක් පවතින බැවින් මෙම අතුරු හෝග ඉවත් කර ප්‍රාදේශීය සභා මාර්ග වල මායිම් ලකුණු කිරීමට කටයුතු සිදු කරන ලෙස ඉල්ලීම් කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

සමීර මන්ත්‍රීතුමාගේ යෝජනාවට අතුරු යෝජනාවක් වශයෙන් මෙම අනවසර වගාවන් සම්බන්ධයෙන් පවතින නීතිමය තත්ත්වය පිළිබඳ මහජනතාව දැනිවත් කළ යුතු බව ත්,තව ද මාර්ග සංවර්ධන අධිකාරිය, ගොවිජන සේවා මධ්‍යස්ථානය, සභාවේ සිටින කාර්මික නිලධාරි මහත්මීන්ගේ ඍජු මැදිහත් වීම මත මේ සම්බන්ධව අවශ්‍ය උපරිම ක්‍රියාමාර්ග ගැනිම සුදුසු බවත්, අඩි 16 පාර අඩි 12 දක්වා අඩු වී ඇති බවත්, මාර්ගවල බෝක්කු කඩා මාර්ග සකසා ඇති බවත් දන්වා සිටින අතර පනතට අනුව නීතිමය වශයෙන් කටයුතු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධව සභාවක් ලෙස අපට මැදිහත් විය නොහැකි බවත්, මෙම අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධව දුම්රිය දෙපාර්තමේන්තුව හා මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තු වලට ලිඛිතව සභාපතිතුමාගේ මැදිහත් වීම මත දැනුම් දීම් සිදුකර ඇති බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස ඊයේ මාරගසක් ඉවත් කළ බවත්, තවත් ගසක අතු ඉවත් කළ බව දැන්වූ අතර අනෙකුත් මාර්ග සම්බන්ධවද මෙම ආයතන ලිඛිතව දැනුවත් කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මෙම යෝජනාවට පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් සහයෝගය ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධව ඔහුගේ ස්තූතිය ප්‍රකාශ කරන ලදි.
සභා පාරවල් වල මෙවැනි අනවසර ඉවත් කිරීම් සිදු කළ විට මන්ත්‍රීවරු හැටියට අපට ගමට යාමට අපහසුතා ඇතිවිය හැකි බවත්, එක එක මාර්ග තනිව සිදු නොකර රඹුක්කන ආසනය පුරාම පවතින සභා පාරවල් සියල්ලම මෙම යෝජනාව යටතේ පිළිසකර කිරීමට කටයුතු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී .තවද සභා මාර්ග සම්බන්ධව දුම්රිය දෙපාර්තමේන්තුව හා මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව දැනුවත් කළ ද කිසිදු ප්‍රතිඵලයක් නොමැති බවත්, වගා කිරීම් කිරීමට අවශ්‍ය පුද්ගලයින් සිටිනම් සභාව හැටියට අපි මැදිහත් වෙලා ඔවුනට අවශ්‍ය ස්ථාන ලබාදීමට කටයුතු සිදු කරමුයි ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දුම්රිය දෙපාර්තමේන්තුව හා මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සතු මාර්ග සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට ඔවුන්ට ලිඛිතව දැනුම් දී තිබෙන බවත්, සභා මාර්ග සියල්ලම ඇතුළත් වන පරිදී මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
සභා මාර්ග සියල්ලම ඇතුළත් වන ආකාරයට මාර්ගයේ සීමා ලකුණු කර සීමාව තුළ මල්පැළ හා වගාවන් ඉවත් කිරීමට තීරණය විය.

iii. ප්‍රාදේශීය සභාව මූලික කර ගනිමින් ගෙවතු වගා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මෙම ඇතිවී ඇති ව්‍යවසනකාරී තත්ත්වය හමුවේ ඉදිරියේ දී එළවළු වල මිල ඉහළ යාමේ අවදානමක් පවතින බැවින් ගෙවතු වගා වැඩසටහනක් ලෙස එළවළු බීජ ලබා දී සභාවක් විදිහට මහජනතාවට සහාය දක්වමුයි ප්‍රකාශ කරන ලදී. කහ හිඟයක් පැවති පෙර අවස්ථාවක සභාව මැදිහත් වී කහ බීජ ලබා දුන් බව ඔහු විසින් තවදුරටත් සිහිපත් කරන ලදී. පෙර පැවැති රජයන්හි අහිතකර පැත්ත පමණක් නොව හිතකර පැත්ත ගැන ද සාකච්ඡා කළ යුතු බව තවදුරටත් එතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දිළිඳුකම පිටු දැකීමේ වැඩපිළිවෙළ යටතේ මෙය ක්‍රියාවට නැංවිය හැකි බවත්, පස් අවුරුදු සැලැස්මෙහිද මේ සම්බන්ධව යෝජනාවක් පවතින බැවින් මෙම යෝජනාව ක්‍රියාවට නැංවීමට හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

පස් අවුරුදු සැලැස්මෙහි ද අන්තර් බැවින් දිළිඳුකම පිටු දැකීමේ වැඩපිළිවෙළ යටතේ ක්‍රියාවට නැංවීමට තීරණය විය.

**(ඊ).06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

i. කඩිගමුව වසමේ කඩිගමුව කහකොළලන්ද මාර්ගය සංවර්ධන කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

පවුල් 25 ක් පමණ භාවිතා කරන(ඔවුනගේ අත්සන් සහිත ඉල්ලීම් ලිපියක් ඇති බවත්) මෙම මාර්ගයෙහි පැති බැම්මක් නොමැති බැවින් ඇලෙහි වතුර වැඩි කාලයට ඉවුරු කඩාගෙන ගොස් පාර අබලන් තත්ත්වයට පත්විය හැකි බවත්, මාර්ගය කොන්ක්‍රීට් කර පවතින බවත්, පැති බැම්මක් ඉදිකර මාර්ගය ආරක්ෂා කිරීමේ අරමුණින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, මාර්ගය අබලන් වුවහොත් විකල්ප මාර්ගයක් ලෙස පත්තම්පිටියට ගොස් ඉලුක්ගල්ල හරහා කෙම්පිටිය මාර්ගය හරහා තම ගමනාගමනය සිදු කිරීම සිදුවන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

මේ වන විට මාර්ගයට කොන්ක්‍රීට් යොදා පවතින බවත්,ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් පැති බැම් ඉදිකර ඇති බවත්, එම පැති බැම් මාර්ගය ගිලා බැස ඇති ස්ථාන කිහිප තැනකින්ම ඇල වී ඇති බවත්, මෙම පැති බැම් දැමීම සඳහා සභාවක් හැටියට අපට මැදිහත් විය නොහැකි බවත්, පැති බැම්ම දැමීම ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් සිදුකළ යුතු බවත් ,දමා ඇති පැති බැම් වලත් කාණු පද්ධතියේ අඩිය සකසා නොමැති බැවින් මෙසේ පැති බැම්ම ඇල වී ඇති බවත් ප්‍රකාශ කළ අතර සභාව මැදිහත් වී එම ආයතනය දැනුවත් කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ගත හැකි වුවහොත් බොහෝ ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් පැතිබැම්ම ඉදිකිරීමට ගොවි සංවිධාන හරහා අනුමැතිය ලබා ගැනීමට හැකි බවත්, පැති බැම්ම වෙල පැත්තෙන් බඳිනවාද ඇල පැත්තෙන් බඳිනවාද යන්න තීරණය කිරීම සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී තීරණය කළ හැකි බවද ලිඛිතව එම ආයතනය දැනුවත් කළ විට ඔවුන් ඒ සම්බන්ධව පර්යේෂණයක් කර අවශ්‍ය ක්‍රියාමාර්ගය ගනු ඇතැයිද මුලින්ම තිබෙන පාර ආරක්ෂා කර ගැනීම සිදුකළ යුතු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව කාර්මික නිලධාරීන් දැනුවත් කර ඇති බවත්, ඔවුන්ගේ වාර්තාව අනුව අවශ්‍ය කටයුතු සිදුකිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධයෙන් ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

කාර්මික නිලධාරී වාර්තාව අනුව කටයුතු කිරීමට තීරණය විය.

ii. උඩුගම/ ගොන්දැවල වසමේ උඩුගම ප්‍රධාන මාර්ගයේ බුදු මැදුර අසල සිට පුංචි වැලිකන්ද ජනපද මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

ප්‍රධාන මාර්ගයේ සිට ජනපද මාර්ගය ආරම්භක ස්ථානයෙහි බෝක්කුවක් පවතින බවත්, වාර්ෂාවත් සමඟ එම බෝක්කුව හරහා ගලා එන ජලය මෙම ස්ථානයෙන් පාර හරහා ගලායන බැවින් මාර්ගය වළවල් සෑදී ඇති බවත්, එම නිසා එම ස්ථානයට "U" හැඩයේ කාණුවක් දැමීමට අපේක්ෂා කරන අතර එය මාර්ගය සංවර්ධනය කිරීමක් ලෙස යෝජනා කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව ක්‍රියාවට නැංවිය හැකි බවත් ඒ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

උඩුගම ප්‍රධාන මාර්ගයේ බුදු මැදුර අසල සිට පුංචි වැලිකන්ද ජනපද මාර්ගය ආරම්භක ස්ථානයේ බොක්කුවක් අසල මාර්ග කොටස "U" හැඩයේ කාණුවක් දමා සංවර්ධනය කිරීම තීරණය විය.

iii. උඩුගම - කඩිගමුව සේරමැඩිල්ල වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

මෙම මාර්ගය පරිහරණය කරන පුද්ගලයින් 48 දෙනෙකුගේ අත්සන් සහිත ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්, මිනිස් ශ්‍රමයෙන් දායකත්වය ලබාදීමට ඔවුන් එකඟ බවද දන්වා ඇති බවත් ප්‍රකාශ කරන ලදී. තවද මෙම මාර්ගය මේ වන විට නාය යාමටද ලක්ව ඇති බවත්, සම්පූර්ණ මාර්ගයම සංවර්ධනය කිරීම අපහසු බැවින් අත්‍යවශ්‍යම කොටස් කිහිපයක් හෝ සංවර්ධනය කරදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පවතින ව්‍යසනකාරී තත්ත්වය හමුවේ සියලුම ග්‍රාමීය මාර්ග අධීක්ෂණය කළ යුතු බවත්, ඉන් අනතුරුව කාර්මික නිලධාරී වාර්තා අනුව මාර්ග සංවර්ධන කටයුතු වලට යාම සුදුසු බවත්, ග්‍රාමීය සියලුම මාර්ග සංවර්ධනය කිරීම මින් අපේක්ෂා නොකරන බවත්, අත්‍යාවශ්‍යම මාර්ග සංවර්ධනය කිරීම සිදුකරන බවත් ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ග්‍රාමීය මාර්ග අධීක්ෂණය කර,කාර්මික නිලධාරි වාර්තා අනුව අත්‍යවශ්‍යම මාර්ග සංවර්ධන කිරීමට තීරණය විය.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ආපදාවට පත් ජනතාවට සහන ලබාදීම සම්බන්ධ ලිපියක් රුක්මන් මන්ත්‍රීතුමා ඉල්ලා ඇති බවත්,එතුමාට එය සභාවට ඉදිරිපත් කිරීමට අවසරය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

**(ඊ).07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

01. අප ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති අනතුරුදායක ගස් ඉවත් කර දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

සභාවට ලබා දී ඇති අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධව අයදුම්පත් රාශියක් ලැබී ඇති බවත්,ඒ සම්බන්ධව කඩිනමින් කටයුතු කළ යුතු බවත්,විෂය නිලධාරියාට එය පරීක්ෂා කිරීමට යාම අපහසු බැවින් අදාළ පුද්ගලයින්ට එම ගස් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස දැන්වීම සුදුසු බවත්,ඔහුගේ සහයෝගය නොලැබේ නම් එම ගස් ඉක්මනින්ම කපා ඉවත් කිරීමට අදාළ මිලගණන් කැඳවීම කඩිනමින් සිදුකිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**
අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධව ඔහුගේත් යෝජනාවක් පවතින බවත්, ඒ අනුව 2018 වර්ෂයේදී සභා නියෝගයක් ලබා දී ඇති මෙම මහෝගස් 5 න් යුත් පේළිය තවම කපා ඉවත් කර නොමැති බවත්,එම ගස් පේළියට පහළින් නිවාස පේළියක්ද පවතින බවත්, ඒ සම්බන්ධව තමාට ලිපියක් ලැබී ඇති බවත් පවසන ලද අතර සභා නියෝගයක් ලබාදී ඇති එම ගස් ඉවත් කර නොමැති එක ගැටළුවක් බවත්,මේ අවස්ථාව වන විට එම ගස් වර්ධනය වී ඇති බවත්, නිවාස වලට වන හානිය අධික බවත් හැකි ඉක්මනින් එම ගස්ඉවත් කිරීමට කටයුතු කිරීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අනතුරුදායක ගස් සම්බන්ධව තවත් යෝජනා පවතීද යන්න ප්‍රශ්න කළ අතර හැකි ඉක්මනින් එම ගස් ඉවත් කිරීමට කටයුතු කළ යුතු බවත්, ගස් කැපුම්කරුවකු යොදවා ගස් ඉවත් කිරීම කළ හැකි බවත්, කැපුම් ගාස්තුව අදාළ ගස් අයිතිකරු විසින් ගෙවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ගස් කැපුම්කරුවකු යොදවා ගස් ඉවත් කිරීම කළ හැකි බවත්, කැපුම් ගාස්තුව අදාළ ගස් අයිතිකරු විසින් ගෙවිය යුතු බවත් තීරණය විය.

02. නාය ගිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට සහ නිවාස වල පස් ඉවත් කර ගැනීමට අප ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍රය ලබාදීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අනතුරක් වූ සැණින් එම ස්ථානය ශුද්ධ කිරීමට යාම සුදුසු නැති බවත්, ඒ සඳහා අදාළ ආයතන වලින් අනුමැතිය ලැබිය යුතු බවත්, මේ වන විට වළකඩයාව නාය ගිය ස්ථානයට බැකෝ යන්ත්‍රය යවා ඇති බවත්, එහෙත් මේ වන තෙක් එම පස් ඉවත් කිරීමට අනුමැතිය ලැබී නොමැති බවත් පවසන ලද අතර මේ අවස්ථාවේදී කාලය ඉතා වටිනා බැවින් අවශ්‍ය ස්ථානය හරිහැටි සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට ඔබතුමන්ලා/තුමියන්ලා කාරුණික වන ලෙසත් ජල හා ගලි බවුසර් සේවාවන් ලබා ගන්නා විට අදාළ ජලධාරිතාව ගබඩා කිරීමට අවශ්‍ය පියවර ගෙන ජල බවුසරය ඉල්ලුම් කරන ලෙසත්, සේවාව ලබාගත් සැනින් එය නැවත සභාවට එවන ලෙසත් දන්වා සිටින ලදී.
තවද කඩිගමුව පන්සලේ ස්වාමීන් වහන්සේගේ හැසිරීම ගැන කණගාටුව ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කරගන්නා බවත්, ඊට හේතුව ගලි බවුසරයෙහි අවශ්‍යතාව පවතින බැවින් එය ලබාදිය හැකිද ඇසූ බවත් ඊට පිළිතුරු ලෙස ගලි බවුසරය යැවූ බවත් නමුත් ගලි බවුසරය නැවත ලබා දෙන විට රාත්‍රී 12 ත් පසු වූ බවත් ඒ හේතුව නිසා සභාවක් හැටියට අප බොහෝ අපහසුතාවයන්ට ලක්වූ බවත් ප්‍රකාශ කරන ලදී.

## ඊ. II . කල් දී නොමැති යෝජනා

**ඊ. II . 01.**
**2025 11.04 දින පැවති කාර්මික සේවා කමිටු යෝජනාව මහ සභා අනුමැතියට යෝජනා කරමි.**

රඹුක්කන සභාව සතු PF-7429 අංක දරණ කැබ් රථය 2025.09.19 දින අනතුරට ලක් වූ අතර ඒ සඳහා එම රථයේ ආනයනකරුවන් හා සේවාකරු වන යුනයිටඩ් මෝටර්ස් වෙතින් හා අප සභාවේ ලියාපදිංචි හා සුදුසුකම් ලත් ආයතනයක් වන සුසන්ත මෝටර්ස් වෙතින් මිල ඇස්තමේන්තුවක් ලබාගෙන ඇත. තීරණ ගැනීමට පහසුවන පරිදි අමතර විස්තරයක්ද අමුණා ඇත.

රක්ෂණ සමාගම බෆර් එකේ අළුත්වැඩියාට රු.4,500.00ද, බඳ ලයිට් එකේ වෙළෙඳපල මිලෙන් 75%ක්ද, අනෙකුත් වැඩ කොටස් සඳහා රු.67,500.00ද, ගෙවීමට එකඟවී ඇත. ඒ අනුව කාර්මික සේවා කමිටු යෝජනාව වනුයේ සුසන්ත මෝටර්ස් ආයතනයෙන් සිදු කිරීමයි. ඊට අවශ්‍ය මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

සුසන්ත මෝටර්ස් ආයතනය මඟින් සිදු කිරීමට තීරණය විය.

## ඊ. II . 02.

2025 දෙසැම්බර් මස 31 පෙ.ව 8.00 සිට 2026 ජනවාරි 01 දින පෙ.ව 8.00 දක්වා රඹුක්කන අශෝක ක්‍රිඩාංගනය නොමිලයේ ලබා දෙන ලෙසත්, ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් ප්‍රචාරය ලබා දෙන ලෙසත් එස්.පී. වික්‍රමසිංහ මහතා විසින් ඉල්ලීම් කර ඇත. එය මහ සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ක්‍රිඩාංගනය ලබාදීම සම්බන්ධ ගැටළුවක් නොමැති බවත් එම කාර්ය සම්බන්ධ ප්‍රචාරණ කටයුතු ඔහු විසින් සිදු කරගත යුතු බවත් ප්‍රකාශ කළ අතර **අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.**

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ක්‍රිඩාංගනය නොමිලයේ ලබා දීමට එකඟ වීමත්,එම කාර්යට සම්බන්ධ ප්‍රචාරන කටයුතු ඔහු විසින් සිදු කරගත යුතු බවත් තීරණය විය.

## ඊ. II . 03.

2026 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම මහසභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.අනුර පියරත්න මැතිතුමා**

කල් දී නොමැති යෝජනා වල පවතින්නේ ඉදිරි වර්ෂයේදී සභාව විසින් සිදුකිරීමට අපේක්ෂිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මයන් බවත්, අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී හා පස් අවුරුදු සැලැස්ම සකස්

කිරීමේදීත් විපක්ෂ මන්ත්‍රීවරුන් විවිධ ඉල්ලීම් සිදුකළ බවත්, එම කිසිවක් ඒවායේ අන්තර්ගතව නොමැති බැවින් 01,02,10,11 යෝජනා වලට එකඟ බවත්, ඉතිරි යෝජනා වලට විරුද්ධ බවත් ප්‍රකාශ කරන්න ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඡන්දයකට යාම සුදුසු බව ප්‍රකාශ කළ අතර ඡන්දයකට යන ලදී. ඒ අනුව රුක්මන් මන්ත්‍රීතුමා, තෙන්නකෝන් මන්ත්‍රීතුමා හා නිරංජලා ජීනදාස මන්ත්‍රීතුමිය විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

තීරණය -

2026 වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුමත කිරිම තීරණය විය.

## ඊ. II . 04.

වාර්ෂික තිරසර සංවර්ධන සැලැස්ම - 2026 සභා අනුමැති ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මුද්‍රණ ගාස්තු කොතෙක් ගියාද සැලැස්ම කියවා තේරුම් ගැනීමට අවශ්‍ය බැවින් අදාළ සැලැස්මෙහි පිටපතක් සෑම මන්ත්‍රීවරයකුටම ලබාදිය යුතු බවත්,අදාළ නිලධාරියා ළඟට යාම මන්ත්‍රීවරයකුට සුදුසු නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

හදිසි ව්‍යසනාකාරී තත්ත්වය නිසා රාජකාරී බොහෝමයක් පවතින බැවින් මෙම යෝජනා 03 ට ආදාළ විෂය නිලධාරින් දැනුවත් කර What App හෝ E mail කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පළාත් සභා මාර්ගෝපදේශ මාලාවක් යටතේ සකස් කරන ලද වාර්තාවක් බවත්, මෙහි ඇතුලත් දේ සිදුකිරීම අත්‍යවශ්‍ය බවත්, එසේ නොකර සිටිය හොත් නීතිමය පියවර ගන්නා බවක් වත් නොමැති බවත්, හුදෙක් මෙය ඉදිරිපත් කිරීමට සැකසූ ලිඛිත වාර්තාවක් පමණක් බවත්, අදාළ සැලැස්මෙහි PDF එකක් What App group එකට යොමු කරන බවත් ප්‍රකාශ කරන ලද අතර අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2026 වාර්ෂයට අදාළ වාර්ෂික තිරසර සංවර්ධන සැලැස්ම අනුමත කිරීම තීරණය විය.

## ඊ. II . 05.

රඹුක්කන ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2026 වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීම තීරණය විය.

### ඊ. II . 06.

ගබ්බල ගම්වාසීන්ගේ ඉල්ලීම මත නාය යෑමට ලක් වූ ගබ්බල ගම මැද මාර්ගය සංවර්ධනය කිරීම සඳහා 2025.10.08 දින මහා සභාවේ දී රු.2,600,000.00 ඇස්තමේන්තුව අනුමත කරන ලදී. නමුත් රුපියල් මිලියන 2ට වැඩි ව්‍යාපෘති 2024 ප්‍රසම්පාදනය මාර්ගෝපදේශයන් අනුව ප්‍රසම්පාදනය කළ යුතු වේ. එබැවින් එම ඇස්තමේන්තුව වැට් මුදල් ඇතුළත් කර සකස් කරන ලදී. එම වැට් ඇතුළත්ව සකස් කරන ලද රු.3,050,000.00 වටිනා සංශෝධිත ඇස්තමේන්තුව (සභා අරමුදල් මේ සඳහා යොදවයි)අනුමැතියට ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**
රු.2,600,000.00 ක ඇස්තමේන්තුව රු.3,050,000.00 ලෙස වැඩි විමට හේතුව විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
රුපියල් මිලියන 2 ට වැඩි ව්‍යාපෘතිය 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතු බවත්, ඒ අනුව vat ඇතුලත් කර සකස් කිරීමේදී රු 3,050,000.00 ලෙස ඇස්තමේන්තුව වෙනස් වූ බවක් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
මන්ත්‍රීවරුන් හට ලබා දෙන ජලයෙහි අපිරිසිදුතා පවතින බැවින් ජල බෝතල් ලබා දෙන ලෙස යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙවැනි ව්‍යසනකාරී අවස්ථාවක තම සුඛවිවරණය ගැන පමණක් නොසිතන ලෙස ජල හා ජලාපවාහන මණ්ඩලය මේ අවස්ථාවේ ජලය කෙසේ හෝ ලබාදීම ගැන සෑහීමකට පත්වන ලෙසත්, බොහෝ ජනතාවකට මේ අවස්ථාවේ බීමටවත් ජලය නොමැති තත්ත්වයක සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

සභා ගර්භයේ සෝෂා

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු.3,050,000.00 ක් වටිනා සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කිරීම තීරණය විය.

**ඊ. II . 07.**
ඒරියාවය කරුණාරත්න ගම මාර්ගයේ ඉදිකරමින් යන කාණුව සඳහා යකඩ දැල් රාමුවක් සවිකිරීම සඳහා වන රු.114,000.00ක් ඇස්තමේන්තුව සඳහා (මේ සඳහා සභාවේ අරමුදල් දැරීමට සිදුවේ. (පොදු අරමුදල් 2025)) අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු.114,000.00 ක් වටිනා ඇස්තමේන්තුව අනුමත කිරීම තීරණය විය.

**ඊ. II . 08.**
අඹතැන්න හීනාබෝව මාර්ගයේ වෙල මැද කැඩී ගිය ස්ථානය බෝක්කු බට යොදා සංවර්ධනය කිරීම සඳහා වන රු.250,000.00ක් වන ව්‍යාපෘතිය කන්සලගමුව සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයට ලබාදීමට සහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු.250,000.00 ක් වන ව්‍යාපෘතිය කන්සලගමුව සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය වෙත ලබාදීමට තීරණය විය.

**ඊ. II . 09.**
ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2025 යටතේ සේනානායක මාවත අනුර ගරාජය මාර්ගය සංවර්ධනය කිරීම (මොට්ටප්පුලිය වසම) රු.1,000,000.00 ව්‍යාපෘතිය රඹුක්කන සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ලබාදීමට අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු.1,000,000.00 ක ව්‍යාපෘතිය රඹුක්කන සී/ස රඹුක්කන විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලබාදීමට තීරණය විය.

### ඊ. II . 10.
GIS තාක්ෂණය යටතේ මැනුම් කරන ලද පාරවල් (මාර්ග) ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කිරීම. පළමු අදියරය යටතේ A1 මාර්ගයට අයත් සහා පාරවල් 64 ගැසට් කළ අතර ඉතිරි මාර්ග දෙවන අදියරය යටතේ ගැසට් කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- **අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.**

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
ඉතිරි මාර්ග දෙවන අදියරය යටතේ ගැසට් කිරීම සඳහා අනුමත කිරීම තීරණය විය.

### ඊ. II . 11.
බැකෝ යන්ත්‍රයක අවශ්‍යතාවය.
දැනට පවතින අයහපත් කාලගුණය නිසා නව බැකෝ යන්ත්‍රයක් අවශ්‍ය වුවහොත් බැකෝ යන්ත්‍රයක් පිටතින් ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- **අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.**

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අවශ්‍ය වුවහොත් පිටතින් බැකෝ යන්ත්‍රයක් ලබා ගැනීමට තීරණය විය.

### ඊ. II . 12.
සභා අරමුදල් 2025 යටතේ ආපදාවට ලක්ව ඇති කොස්සින්න තිබ්බුට්ට මාර්ගයේ පස් ඉවත් කිරීම සඳහා වන රු.22,300.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු.22,300.00 ක් වටිනා ඇස්තමේන්තුව අනුමත කිරීම තීරණය විය.

**ඊ. II . 13.**
පොදු අරමුදල් 2025 යටතේ කොත්තනවත්ත නවගමුව අරම්බඩ හාල්ගස් කුඹුරේ පාර සංවර්ධනය කිරීම රු.482,000.00ක ව්‍යාපෘතිය කොත්තනවත්ත ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදීමට සහා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු.482,000.00 ක ව්‍යාපෘතිය කොත්තනවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලබාදීමට තීරණය විය.

**ඊ. II . 14.**
ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2025 යටතේ දුනුකේවල ඇලිපාත ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය රුපියල් මිලියන 01 දුනුකේවල පැරකුම් ගොවි සංවිධානයට ලබාදීමට අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රුපියල් මිලියනයක ව්‍යාපෘතිය දුනුකේවල පැරකුම් ගොවි සංවිධානය වෙත ලබා දීමට තීරණය විය.

**ඊ. II . 15.**

පොදු අරමුදල් 2025 යටතේ මින්වාන මාර්ගයේ කැඩී ඇති බොක්කුව අලුත් වැඩියා කිරීම සඳහා වන රු.3,200,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු.3,200,000.00 ක් වටිනා ඇස්තමේන්තුව අනුමත කිරීම තීරණය විය.

**ඊ. II . 16.**

පොදු අරමුදල් 2025 යටතේ මල්බෙරියාවත්ත කැබලි අංක දෙක හා නවය අතර ඇති කොන්ක්‍රීට් කානුවෙන් ගලා එන ජලය මාර්ගයේ ඇති බෝක්කුව දෙසට යොමු කිරීම සඳහා වන රු.595,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු.595,000.00 ක් වටිනා ඇස්තමේන්තුව අනුමත කිරීම තීරණය විය.

**ඊ. II . 17.**

දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව ඇති RE -9017 ට්‍රැක්ටරය සහ ජල බවුසරය රඹුක්කන ප්‍රාදේශීය සභා භාරයට ලබා ගැනීමට අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

හදිසි ව්‍යසනකාරී අවස්ථාවේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැති ජල බවුසරය සභා භාරයට ගත් බවත්, තවදුරටත් එහි අවශ්‍යතාවය පවතින බැවිනුත්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එම RE -9007 ට්‍රැපේ ට්‍රැක්ටරය හා ජල බහුසරය අත්‍යවශ්‍යයම නොවන බව දන්වා ඇති බැවින් ප්‍රාදේශීය සභාව භාරයට පවරා ගැනීමට මෙම යෝජනාව ගෙනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

එම ජල බහුසරය රැගෙන ආ අවස්ථාවේ එතුමා එතැන සිටි බවත්,එවැනි සම්පතක් නිකරුණේ අපතේ යැවීම කණගාටුදායක බවත්,හැකිනම් සභා සන්තකයේ තබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

RE -9017 ට්‍රැප්‍රේ ට්‍රැක්ටරය සහ ජල බවුසරය රඹුක්කන ප්‍රාදේශීය සභා භාරයට ලබා ගැනීමට තීරණය විය.

**ඊ. II . 18.**

පොදු අරමුදල් 2025 යටතේ හීනාබෝව ඉහල වෙල මාර්ගය හා ගම මැද මාර්ගය බොරළු දමා සකස් කිරීම ව්‍යාපෘතිය (රු.76,700.00) ක අදාල ස්ථානයට බොරළු දමා සකස් කිරීම ප්‍රායෝගික නොවන හෙයින් 2025.09.02 දින මහ සභා අනුමැතිය ලබා ගත් කර්මාන්තය ඉටු නොකර සිටීමට අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

2025.09.02 දින මහ සභා අනුමැතිය ලබා ගත් රු75,700.00 ක කර්මාන්ත ඉටු නොකිරිමට තීරණය විය.

**ඊ. II . 19.**

පළාත් සහා ඝණ අප ද්‍රව්‍ය සංවරනය යටතේ ලබා දීමට යෝජිත බේල් යන්ත්‍රය සඳහා රු මිලියන 2.26 ක පළාත් සභාව මඟින් ලබා දීමට යෝජිත අතර ඒ සඳහා ඇස්තමේන්තු මුදල රු මිලියන 2.714 වන අතර ඉතිරි මුදල වන රු මිලියන 0.494 ක මුදල ප්‍රාදේශීය සභාව මඟින් යෙදවීමට අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු මිලියන 0.494 ක මුදල ප්‍රාදේශීය සභාව මගින් යෙදවීමට තීරණය විය.

(උ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවේලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස, ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරිම.
2025.11.04 දින හා 2025.11.14 දින පැවත්වන ලද කාර්මික කාරක සභා වාර්තා පිළිගැනිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කර ඇති බවත්,සභාව සතුව පවතින ට්‍රැක්ටර් වලින් 04 ක් අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි මට්ටමේ පවතින බව දන්වන අතර අනිත් ට්‍රැක්ටර් ටික සභාවෙන් අපහරණය කිරීමට ඔබතුමන්ලාගේ අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2025.11.04 දින හා 2025.11.19 දින වල පැවත්වන ලද කාර්මික කාරක සභා වාර්තා පිළිගැනිම සුදුසු බවට තීරණය විය.

**(ඌ). ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලිම.**

නැත

**(එ). සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරිම්.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
සැල්වේෂන් ආමි කඳවුර අවතැන් වූ පුද්ගලයින් සිටින කඳවුරක් බවත්,එහි පුද්ගලයින් 113 ක් පමණ සිටින බවත්,චානු මන්ත්‍රීතුමා ඒ සඳහා ද්‍රව්‍ය හා ආහාර පරිත්‍යාග කළ බවත්,ඒ සම්බන්ධව විශේෂ ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා**
තල්දැව ප්‍රදේශයේ ඉහළ කොටස මේ වන විට නාය ගොස් පවතින බවත්, නිවාස 08 ක් අවතැන්ව ඇති බවත්, ඔවුන් පන්සලෙහි සිටින බවත්, තෝමස් මහතාගේ නිවසට ගලක් හේත්තු වී තිබෙන බවත්, එම ගල පහළට පෙරළී ආවොත් ලොකු විනාශයක් වීමට ඉඩ ඇති බවත්, බෝර දමා එම ගල ඉවත් කිරීමට අපහසු බවත්, කෙමිකල් එකක් දමා එම ගල කඩා ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකි නම් වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
සභාවේ සීමාව තේරුම් ගෙන කටයුතු කරන ලෙසත්, ආපදා කළමනාකරණය කිරීම් පවතින්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය භාරයේ බවත්, එම කරුණු සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් දැනුවත් කිරීම සුදුසු බවත්,

අනතුරක් වූ විට සහාය දැක්වීම අපට කළ හැකි නමුත් අදාළ ආයතන විසින් ඒ සම්බන්ධව තීන්දු තීරණ ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

12.21 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩබ්.එන්.සුරංගනී සෝමදාස මන්ත්‍රීතුමිය සභාගර්භයෙන් ඉවත්ව යන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

කඩිමුව පන්සලේ සිදුවීම සම්බන්ධව මුලින්ම කණගාටුව ප්‍රකාශ කරන බව දන්වා සිටි අතර රඹුක්කන කොට්ඨාශයට බොහෝ අලාභහානි මෙම කුණාටුවත් සමග සිදුවී ඇති බවත් සියලු සංවර්ධන ව්‍යාපෘති පසෙකලා මුලින්ම මෙම හානියට පත් මංමාවත් යථා තත්ත්වයට ගැනීමට අවශ්‍ය කටයුතු එම සංවර්ධන ව්‍යාපෘති වලට වෙන් වී ඇති මුදලින් සිදු කිරීම සුදුසු බව යෝජනා කරන බවත් බොහෝ මාර්ගවල මඩ තැන්පත් වී ඇති බැවින් දැඩි අවධානම් තත්ත්වයක පවතින බවත්, බැකෝ යන්ත්‍රය භාවිතා කර මාර්ගය පිළිසකර කිරීම කඩිනමින් කිරීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

සර්ව ජනබල පක්ෂය ලෙස අවතැන් වූ පුද්ගලයින් සිටින කඳවුරු සඳහා පිසූ ආහාර ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන බවත්, නොමිලයේ වියළි ආහාර ලබාදීමද සිදුකරන බවත්, අවතැන් කඳවුරු පවතින ස්ථාන පිළිබඳව දැනුවත් කරන මෙන් ඉල්ලා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

රඹුක්කන ආසනය පුරා අවතැන් කඳවුරු 12 ක් පවතින බවත්,එම අවතැන් කඳවුරු සඳහා ගලි බවුසර් සේවාව නොමිලයේ ලබාදීමට හැකිනම් එය සෞඛ්‍ය ගැටළු ඉදිරියේදී ඇති නොවීමට මහඟු පිටුවහලක් වනු ඇතැයි ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

කීර්තිරත්න පන්සලේ අවතැන් පවුල් 03 ක් සිටින බවත්, ඒ සම්බන්ධවද සොයා බලා කටයුතු සිදු කළ හැකි නම් වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය**

කිරිවත්දෙණිය වසමේ වටගොඩ පාරෙහි ගමන් ගත් පුද්ගලයෙකු වැසි කාලයේ ගමන් කරන විට ලිස්සා අනතුරකට ලක්ව සිටින බවත්, ඔහුට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා වෛද්‍යවරයකු නිවසට පැමිණෙන බවත්, එම මාර්ගය ගල්පස් යොදා හෝ සංවර්ධනය කිරීමට හැකිනම් වටිනා බවත්, වලකඩයාව නාය යාමට ලක් වූ පුද්ගලයින් කිහිප දෙනෙක්ම කතා කළ බවත්, ඔවුන් විසින් එම පස් ඉවත් කිරීමට කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මෙම ව්‍යසනකාරී අවස්ථාවේ ජීවිතක්ෂයට පත් වූ ජනතාව වෙනුවෙන් ඔහුගේ ශෝකය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත්, සභාව ආරම්භයේදී ඒ වෙනුවෙන් කාලය වෙන් නොවුනු එක ගැන තමාගේ කණගාටුව ප්‍රකාශ කරන බවත්, නමුත් සභාපතිවරයකු ලෙස මෙම අවස්ථාවේදී ඔබතුමන් සිදුකරන කාර්ය සම්බන්ධව ප්‍රශංසාව ප්‍රකාශ කරන බවත්, උප සභාපතිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් මේ මොහොතේ දක්වන සහයෝගය හා ඔවුන්ගේ ක්‍රියාකලාපය අගය කරන බවත්,

02. සභා වාර්තාවේ බොහෝ අඩුපාඩු පවතින බවත්,සංශෝධන ඉදිරිපත් කළ විට එම සංශෝධන සභා වාර්තාවේ අන්තර්ගත නොවන බවත්, බොහෝ අවස්ථාවලදී තමා විසින් ඉදිරිපත් කළ සංශෝධන නොමැති බවත්, එය සන්නිවේදන දෝෂයක් බව ප්‍රකාශ කරන බැවින් සභාවේ බොහෝ විට අදහස් ප්‍රකාශ කරනු ලබන්නේ කීපදෙනෙකු පමණක් බැවින් FM මයික් කීහිපයක් හෝ ගැනීම ඉතා වටිනා බවත්,
03. මීට පෙර පැවැති පාලන කාලයන්හිදී සභාවේදී තම අදහස් ප්‍රකාශ කිරීමට මන්ත්‍රීවරුන් හට අවස්ථාව

නොලැබූ බවත්, ලැබුනේ නම් එය ඉතා සීමිත අවස්ථාවක් බවත්, සභාපතිතුමන්ගේ මෙම ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සම්බන්ධව තම ප්‍රශංසාව හා සතුට ප්‍රකාශ කරන බවත්, එම අවස්ථාව ලබාදී එය වාර්තාවේ ඇතුළත් නොකර සිටීම ගැන කණගාටුව පළ කරන බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන මැතිතුමා**

සභාවේ අඩු පාඩු ඉදිරිපත් කරන විට තමන් සභා ගාර්හයෙන් ඉවත් කරන ලෙස උපසභාපතිතුමා ප්‍රකාශ කර බවත්, තමා දැඩි හිතේ අමාරුවෙන් සිටින බවත්, තම අදහස් ප්‍රකාශ කිරීමටද නොහැකි තත්ත්වයක සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු උපසභාපති ර්.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මෙම ව්‍යසනකාරි අවස්ථාවේ මහජන නියෝජිතයෝ හැටියට ඔබතුමන්ලා බොහෝ උදව් උපකාර සිදුකළ බවත්, ඉදිරියටත් එය අවැසි බවත් විශේෂයෙන්ම කඳවුරු කරා පැමිණීමේදී දැනුම් දීමකින් තොරව පිසූ ආහාර රැගෙන නොයන ලෙසත්,එසේ පිසූ ආහාර ලබාදීමට හැකියාව පවතී නම් අපව හෝ ප්‍රධාන කාර්යාලය දැනුවත් කිරීම මගින් අපතේ යාම්, අවම වන බවත් දන්නා සිටි අතර රඹුක්කන ප්‍රාදේශයේ නොවුවත් කුරුණෑගල ප්‍රදේශයට අයත් නායයාම් අනතුරින් පුද්ගලයින් 07 ක් මියගිය බවත්, සිරුරු 03 ක් ගොඩගත් බවත් 02 ක ආදාහන කටයුතු සිදුකළ බවත්, එක් සිරුරක් කුරුණෑගල රෝහලේ පවතින බවත් එම මියගිය පුද්ගලයින් තමාගේ ඥාතීන් බවත්, මේ අවස්ථාව ඔවුනට ශෝකය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් කරගන්නා බවත්, තෙන්නකෝන් මන්ත්‍රීතුමාට විරුද්ධ වූයේ සංශෝධන ඉදිරිපත් කරන අවස්ථාවේ අනවශ්‍ය අදහස් ප්‍රකාශ ඉදිරිපත් කළ බැවින් බවත් හොඳින් පනත කියවා තේරුම් ගන්නා ලෙසත් ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පාර්ලිමේන්තු මන්ත්‍රී සමන්ත රණසිංහ මැතිතුමා උඩුගම ප්‍රදේශයේ නායයෑම් තත්වයක් පවතින බව සැන්වූ අතර උඩුගම ප්‍රදේශයේ අධික වාර්ෂාව පැවැති මොහොතක සවස 6.00 ට විතර ගිය බවත්, නමුත් නොහිතපු මොහොතක විශාල ජල කඳක් පැමිණි බවත් ඒ හේතුවෙන් එහි යාමට නොහැකි වූ බවත් එම ප්‍රදේශයට අවශ්‍ය කටයුතු සිදුකිරීමට සභාවක් හැටියට මැදිහත් වන බව ප්‍රකාශ කරන ලදී.
තවද කීර්ති සුමනරත්න මන්ත්‍රීතුමාගේ ඉල්ලීම් ලිපියක් පවතින බවත්, එහි සඳහන් පරිදි නිවාස 07/08 ක් අවදානම් තත්ත්වයේ පවතින බැවින් කඳවුරු වල සිටින බවත්, ඔවුන්ගේ ඉදිරි ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීමට කළ හැකි දෑ සිදු කිරීමට මැදිහත් වන ලෙසත්, මීදෙණියාවත්ත මාර්ගය දෙපස කාණු පද්ධතිය සකස් කර දෙන ලෙසත් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.
පවතින අනපනත් චක්‍රලේඛ ලිහිල් කර චක්‍රලේඛනයක් නිකුත් කර ඇති බව ප්‍රකාශ කළ අතර ඒ අනුව තාක්ෂණ නිලධාරි මහතෙකුගේ අධීක්ෂණය යටතේ බැකෝ යන්ත්‍රය භාවිතා කරන බැවින් සභාවට එය බල නොපාන බවත් නමුත් මේ අවස්ථාවේදී වංචා දූෂණ සිදු නොකර විශේෂයෙන්ම රාජ්‍ය දේපළ අවභාවිතා නොකර හරිම දේ සඳහා යොමුවෙමුයි ප්‍රකාශ කරන ලදී.

අවසානය

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ස්තුතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 12.35 ට පමණ අවසන් කරන ලදී.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක

සභාපති,

රඹුක්කන ප්‍රාදේශීය සභාව.